# කාර්ය සාධන වාර්තාව

# 2012

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

*නො. 42,*

*ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,*

*තැ.පෙ. 537,*

*කොළඹ - 07.*

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

## ඉදිරි දැක්ම

*" ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ හා
සියළු කෘෂිකාර්මික ඉඩම්වල තිරසාර
සංවර්ධනය "*

## මෙහෙවර

*" ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසාර සංවර්ධනය
හා
සියළු කෘෂිකාර්මික ඉඩම්වලින්
ප්‍රශස්ථ ඵලදායිතාවයක් ලබා ගත හැකි වන පරිදි
ආයතනික, සහායක, නෛතික හා කළමනාකරණ
සේවාවන් සැකසීම හා කාලානුරූපව
පවත්වා ගෙන යාම"*

## ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් තුමාගෙන්.........

පාරම්පරිකව පැවත එන ගොවිජන සංස්කෘතියකින් පෝෂණය වු ප්‍රෞඪ ඉතිහාසයකට ශ්‍රී ලංකාව උරුමකම් කියාපායි. එම ඉතිහාසයේ සිට පාරම්පරික ගොවි ඥාණයෙන් ඇරඹුණු ශ්‍රී ලංකාවේ භෝග වගාව, නව විද්‍යාත්මක හා තාක්ෂණ දැනුමින් සන්නද්ධ වී නවීන කෘෂි විද්‍යාවක් ලෙසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මග පෙන්වීම මත දැයට බත සැපයීමට පුරෝගාමී මෙහෙයක් ඉටු කරයි. රටෙහි පෝෂණ අවශ්‍යතා ඉටු කරනු වස් වගා කළ හැකි සෑම බිම් අඟලක්ම වගා කිරීමට අවශ්‍ය නෛතික පසුබිම අප දෙපාර්තමේන්තුව විසින් සකස් කරමින් තිබේ.

රට සහලින් ස්වයංපෝෂිත කිරීමේ අතිගරු ජනාධිපති තුමන්ගේ බලාපොරොත්තු මල් ඵල ගැන්වී ඇති මෙවන් අවධියක ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේහි සමස්ථ කාර්යය සාධනය විදහාපාන 2012 වසරේ කාර්යය සාධන වාර්තාව මෙලෙසින් එළි දැක්වීමට හැකිවීම මහත් භාග්‍යයක් කොට සලකමි. ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසාර සංවර්ධනය හා සියලුම කෘෂිකාර්මික ඉඩම් වලින් ප්‍රශස්ථ ඵලදායීතාවය ලබා ගත හැකි වන පරිදි වන ආයතනික , සහයක , නෛතික හා කළමනාකරණ සේවාවන් සැකසීම හා කාලානුරූපව පවත්වාගෙන යෑම මෙහෙවර කොටගත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ඒ වෙත පැවරුණු ඉලක්කයන් වෙත ලඟා වීම සඳහා උපයෝගී කරගන්නා ලද ක්‍රමෝපායන් හා සම්පත් පිළිබඳ විස්තරාත්මක තොරතුරු මෙම වාර්තාවෙහි අඩංගු වේ.

මෙම මහඟු කාර්යය ඉටු කිරීම සඳහා 2012 වසරේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත නායකත්වය ලබා දුන් ගොවිජන සේවා හා වන ජීවී අමාත්‍යතුමන් ප්‍රමුඛ ගොවිජන සේවා හා වන ජීවී අමාත්‍යාංශයටත් , සියළු බාධක හමුවේ අඛණ්ඩව හා කැපවීමෙන් ක්‍රියා කළ දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයේ සියළුම නිලධාරීන්ටත් 2012 ක්‍රියාකාරී සැලැස්ම නිසි ලෙස ක්‍රියාත්මක කරගැනීමට අප හට නන් අයුරින් උදවු උපකාර කල ශ්‍රී ලාංකීය ගොවි ජනතාවටත් මාගේ අවංක ස්තූතිය පුද කරමි.

එම්. ඒ. එස්. වීරසිංහ.
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

# පටුන

පිටු අංකය


❖ පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය. 01

❖ සංවර්ධන හා ප්‍රගති පාලන අංශය. 14

❖ ප්‍රධාන ඉංජිනේරු අංශය. 19

❖ ආයතනික සංවර්ධන අංශය 20

❖ ප්‍රවාහන අංශය. 26

❖ නීති අංශය. 27

❖ ගිණුම් අංශය. 30

❖ අභ්‍යන්තර විගණන අංශය. 34

❖ ඵලදා වර්ධන හා අලෙවි අංශය. 35

❖ ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය 38

❖ ජල කළමනාකරණ අංශය. 43

ඇමුණුම්. ##

# 1. පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

## 1.1 ආයතන අංශය.

### 1.1.1 දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව.

දීප ව්‍යාප්ත, ඒකාබද්ධ හා දෙපාර්තමේන්තුගත තනතුරු ඇතුළුව මෙම දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව 12026 කි. 2012 වර්ෂය අවසානය වන විට සේවයේ නිරත වූ සංඛ්‍යාව 10592 කි. පුරප්පාඩු සංඛ්‍යාව 1388 කි. මීට අමතරව ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයෙන් අනුයුක්ත කර ඇති කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර නිලධාරීන් 64ක් ද සංවර්ධන සහකාර නිලධාරීන් 116ක් ද සහකාර අධ්‍යක්ෂවරුන් 27ක් ද මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලැබේ. මෙයින් සහකාර අධ්‍යක්ෂකවරුන් අමාත්‍යාංශයෙන් වැටුප් ලැබීමේ පදනම මත මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇත. අමාත්‍යාංශය වෙතින් වැටුප් ගෙවීමේ පදනම මත මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර සිටි කෘෂිකර්ම පර්යේෂණ හා ඵලදා වර්ධන නිලධාරීන් 14ක් ඇතුලත්ව නිලධාරීන් 25 දෙනෙකු සහකාර අධ්‍යක්ෂකවරු වශයෙන් සමාලෝචන වර්ෂය තුළදී මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ කටයුතු සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් , අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් තනතුර හා කොමසාරිස් තනතුරු 03 ක් ද නියෝජ්‍ය කොමසාරිස් තනතුරු 08 ක් ද අනුමත වී ඇත. සමාලෝචන වර්ෂය අවසානය වන විට මින් නියෝජ්‍ය කොමසාරිස් තනතුරු 04 ක් පුරප්පාඩුව පැවතුණි. දෙපාර්තමේන්තුව සඳහා සහකාර කොමසාරිස් තනතුරු 36 ක් අනුමත වී ඇති අතර ඉන් තනතුරු 05ක් පුරප්පාඩු වී පැවතුණි. ශ්‍රී ලං.ප.සේ නොවන නියෝජ්‍ය කොමසාරිස් (නීති) තනතුර පුරප්පාඩුව පැවතුණු අතර 28ක් වූ අනුමත දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් තනතුරු සංඛ්‍යාවෙන් සමාලෝචන වර්ෂය අවසානය වන විට සේවයේ නිරත වූ සංඛ්‍යාව 04කි. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 24කි.

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ පුරප්පාඩු 02 ක් වූ අතර සමාලෝචන වර්ෂය අවසානය වන විට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පුරප්පාඩු වූ සංඛ්‍යාව 127ක් විය. සමාලෝචන වර්ෂය තුළදී රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට නවක නිලධාරීන් බඳවා ගෙන මෙම දෙපාර්තමේන්තුවට නිලධාරීන් 23ක් අනුයුක්ත කිරීම නිසා පුරප්පාඩු තරමක් සම්පූර්ණ කර ගැනීමට හැකි විය.

### 1.1.2 කාර්ය මණ්ඩල සංවිධාන ව්‍යුහය.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය කාර්ය සාධන මට්ටම පවත්වා ගැනීමට වග කියන අතරම, ඒ සඳහා තමන් යටතේ සේවය කරන විවිධ මට්ටම්වල නිලධාරීන්ට වගකීම් හා බල තල පවරා ඇත.

දෙපාර්තමේන්තුවේ අරමුණු හා අභිමතාර්ථ ලඟා කර ගැනීම සඳහා සහාය ලබා දුන්, සමාලෝචන වර්ෂ අවසානය වන විට සේවයේ නිරත වී සිටි දෙපාර්තමේන්තුවට අනුමත විවිධ තනතුරුවල සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

එම සේවක සංඛ්‍යාව එක් එක් තනතුරු ආශ්‍රිතව පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැකිය.

**2012-12-31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු.**

| අංකය | තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලං.ප.සේ (විශේෂ) | 1 | 1 | - |
| 2 | අතිරේක කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලං.ප.සේ (විශේෂ) | 1 | 1 | - |
| 3 | කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ I | 3 | 3 | - |
| 4 | නියෝජ්‍ය කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ | 8 | 4 | 4 |
| 5 | සහකාර කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ III | 36 | 31 | 5 |
| 6 | නියෝජ්‍ය කොමසාරිස්(නීති) | ශ්‍රී ලං.ප.සේ නොවන | 1 | - | 1 |
| 7 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. I | 1 | 1 | - |
| 8 | ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. | 5 | 4 | 1 |
| 9 | ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ | 11 | 9 | 2 |
| 10 | සහකාර කොමසාරිස් | දෙපාර්තමේන්තු | 28 | 4 | 24 |
| 11 | ගොවිජන සංවර්ධන නිලධාරී | දෙපාර්තමේන්තු | 610 | 447 | 163 |
| 12 | භාෂා පරිවර්තක සේවය | ඒකාබද්ධ | 2 | - | 2 |
| 13 | රාජ්‍ය කළමනාකරණ සේවය අධි පන්තිය | ඒකාබද්ධ | 10 | 8 | 2 |
| 14 | ගොවි බැංකු ව්‍යාපෘති සහකාර | දෙපාර්තමේන්තු | 100 | 53 | 47 |
| 15 | නීති සහකාර | දෙපාර්තමේන්තු | 25 | 14 | 11 |
| 16 | අයවැය සහකාර | උපාධිධාරී | 1 | 1 | - |
| 17 | සැලසුම් ශිල්පී | දෙපාර්තමේන්තු | 1 | 1 | - |
| 18 | යාන්ත්‍රික වැඩ අධිකාරී | දෙපාර්තමේන්තු | 2 | 2 | - |
| 19 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | ශ්‍රී ලං.තා.සේ විශේෂ | 13 | 8 | 5 |
| | | ශ්‍රී ලං.තා.සේ I<br>ශ්‍රී ලං.තා.සේ II | 100 | 76 | 24 |
| 20 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | ඒකාබද්ධ | 538 | 411 | 127 |
| 21 | ප්‍රචාරක නිලධාරී | දෙපාර්තමේන්තු | 1 | - | 1 |
| 22 | ලඝු/ යතුරු ලේඛක* | දෙපාර්තමේන්තු | 47 | 14 | - |
| 23 | ක්ෂේත්‍ර සහකාර* | දෙපාර්තමේන්තු | 6 | 2 | - |
| 24 | කම්තු ලිපිකරු | දෙපාර්තමේන්තු | 553 | 417 | 136 |
| 25 | රියදුරු සේවය | ඒකාබද්ධ | 91 | 75 | 16 |
| 26 | රිය සහයක | දෙපාර්තමේන්තු | 18 | 6 | 12 |
| 27 | මුරකරු | දෙපාර්තමේන්තු | 83 | 56 | 27 |
| 28 | ඩෝසර් යන්ත්‍ර ක්‍රියාකරු | දෙපාර්තමේන්තු | 17 | 14 | 3 |
| 29 | කාර්යාල කාර්ය සහායක | ඒකාබද්ධ | 85 | 70 | 15 |
| 30 | එස්කැවේටර් යන්ත්‍ර ක්‍රියාකරු | දෙපාර්තමේන්තු | 4 | - | 4 |
| 31 | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර | දෙපාර්තමේන්තු | 9600 | 7375<br>1474 | 751 |
| 32 | සංචාරක බංගලා භාරකරු | දෙපාර්තමේන්තු | 7 | 2 | 5 |
| 33 | නුපුහුණු කම්කරු* | දෙපාර්තමේන්තු | 17 | 8 | - |
| | එකතුව | | 12026 | 10592 | 1388 |

***යටපත් වී යන සේවාවකි.**

මීට අමතරව ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයෙන් අනුයුක්ත කර ඇති පහත තනතුරුවල නිළධාරීන්ද මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබයි.

සහකාර අධ්‍යක්ෂ 27

කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර 64

සංවර්ධන සහකාර 116

## 1.1.3. ආයතන කටයුතු.

**(I) 2012 වර්ෂය තුළ දීප ව්‍යාප්ත සේවා වල නිලධාරීන්ගේ විචලතා පහත පරිදි වේ.**

- **2012 වර්ෂය තුළදී මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් වලට අදාල තොරතුරු පහත පරිදි වේ.**

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරුවී ගිය දිනය | ස්ථාන මාරු වී ගිය සේවා ස්ථානය |
|---|---|---|---|
| 01 | එන්.පී.අමරතුංග මයා ශ්‍රී.ලං.ප.සේ. III | 2012.01.03 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |
| 02 | ආර්.පී.ජී.පොඩිනෝරිස් මයා ශ්‍රී.ලං.ප.සේ. III | 2012.01.12 | නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 03 | ඩී.එල්.කේ.ප්‍රියවංශ මයා ශ්‍රී.ලං.ප.සේ. III | 2012.01.27 | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 04 | ඩබ්.ඒ.ඩී.කරුණාතිලක මයා ශ්‍රී.ලං.ප.සේ. I | 2012.01.31 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
| 05 | එම්.යූ.නිශාන්ත මයා ශ්‍රී.ලං.ප.සේ. III | 2012.02.02 | ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 06 | ආර්.එම්.කේ.ආර්.බී.රත්නායක මයා ශ්‍රී.ලං.ප.සේ. III | 2012.04.03 | උතුරු මැද පළාත් කොමිසම |
| 07 | රවීන්ද්‍ර හේවාවිතාරණ මයා ශ්‍රී.ලං.ප.සේ. I (ගො.සං.කො.ජ.) | 2012.05.17 | ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 08 | අයි.කේ.ජී.මුතුබණ්ඩා මයා ශ්‍රී.ලං.ප.සේ. I | 2012.06.29 | වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 09 | එම්.එස්.අවන්ති සේනාරත්න මිය ශ්‍රී.ලං.ප.සේ. III | 2012.07.01 | නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 10 | ජේ.එස්.අරුල්රාජ් මයා ශ්‍රී.ලං.ප.සේ. III | 2012.07.30 | දිස්ත්‍රික් කම්කරු කාර්යාලය , වව්නියාව |
| 11 | ඒ.එම්. ආරිෆ් මයා ශ්‍රී.ලං.ප.සේ. III | 2012.09.01 | දුම්රිය දෙපාර්තමේන්තුව |
| 12 | පී.කොඩිතුවක්කු මිය ශ්‍රී.ලං.ප.සේ. III | 2012.09.16 | නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

- **දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී පැමිණි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් පිළිබඳ විස්තර.**

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරුවී පැමිණි දිනය | ස්ථාන මාරු වී පැමිණීමට පෙර සේවය කළ සේවා ස්ථානය |
|---|---|---|---|
| 01 | එස්.ඩී.කේ.ප්‍රනාන්දු මයා ශ්‍රී.ලං.ප.සේ. I | 2012.01.03 | ආගමන විගමන දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| 02 | අයි.බී.ගුණවර්ධන මිය<br>ශ්‍රී.ලං.ප.සේ. III | 2012.01.17 | ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුව |
| 03 | එන්.ජී.එම්.එස්.කුමාර මයා<br>ශ්‍රී.ලං.ප.සේ. III | 2012.02.16 | වළපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 04 | කේ.පී.ආර්.එච්.සිල්වා මයා<br>ශ්‍රී.ලං.ප.සේ. III | 2012.02.16 | ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 05 | බී.එන්.ඩී.කුමාර මයා<br>ශ්‍රී.ලං.ප.සේ. III | 2012.03.02 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |
| 06 | එම්.ඒ.එස්.වීරසිංහ මයා<br>විශේෂ ශ්‍රේණිය | 2012.05.14 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |
| 07 | කේ.සුලෝජනී මිය<br>ශ්‍රී.ලං.ප.සේ. III | 2012.07.23 | වව්නියාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය |
| 08 | කේ.එල්.එම්.සී.කුලරත්න මිය<br>ශ්‍රී.ලං.ප.සේ. I | 2012.08.29 | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 09 | ආර්.පි.කළුපහන මයා<br>ශ්‍රී.ලං.ප.සේ. III | 2012.09.12 | නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 10 | ජේ.ඩී.එන්.එස්.ජයකොඩි මයා<br>ශ්‍රී.ලං.ප.සේ. III | 2012.10.01 | නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| 11 | ආර්.එම්.එන්.විජේතුංග මයා<br>ශ්‍රී.ලං.ප.සේ. III | 2012.10.01 | විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය<br>මධ්‍යම පළාත |

❖ **2012 වර්ෂයේ ශ්‍රී.ලං.ගණකාධිකාරී සේවයේ හා ඉංජිනේරු සේවයේ ස්ථාන මාරුවීම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ**

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරුවී ගිය දිනය | ස්ථාන මාරු වී ගිය සේවා ස්ථානය |
|---|---|---|---|
| 01 | එස්.පී.ගාමිණී මයා<br>ශ්‍රී.ලං.ගණකාධිකරණ සේවය | 2012.05.25 | සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය |
| 02 | ඒ.එල්.එම්.මහීර් මයා<br>ප්‍රාදේශීය ඉංජිනේරු | 2012.10.16 | උඩරට ගැමි පුනරුත්තාපන දෙපාර්තමේන්තුව. |

❖ **නව පත්වීම් ලද දීප ව්‍යාප්ත සේවා වල නිලධාරීන් පිළිබඳ තොරතුරු**

| අනු අංකය | නිලධාරියාගේ නම | සේවය | අනුයුක්ත දිනය |
|---|---|---|---|
| 01 | පී.කොඩිතුවක්කු මිය | ශ්‍රී.ලං.ප.සේ III | 2012.01.02 |
| 02 | ඩබ්.එච්.ඩී.ශ්‍යාමලී මිය | ශ්‍රී.ලං.ප.සේ III | 2012.01.02 |

උක්ත නම් සඳහන් නිලධාරීන් 2011.10.25 දින සිට පුහුණුවීම් සඳහා මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටි අතර 2012.01.02 දින සිට මෙම දෙපාර්තමේන්තුවේ සේවයට ස්ථිරව අනුයුක්ත කරන ලදී.

## (II) නව බඳවා ගැනීම්.

සමාලෝචන වර්ෂය තුළ මෙම දෙපාර්තමේන්තුවට නව පත්වීම් ලබා පැමිණි ශ්‍රී.ලං.ප.සේවයේ නිලධාරීන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | නිලධාරියාගේ නම | සේවය | අනුයුක්ත දිනය |
|---|---|---|---|
| 01 | බී.එම්.සී.කුමාරිහාමි මෙය | ශ්‍රී.ලං.ප.සේ III | 2012.09.24 |
| 02 | එන්.පී.ගමගේ මිය | ශ්‍රී.ලං.ප.සේ III | 2012.09.24 |
| 03 | එම්.ඊ.වීරසිංහ මෙය | ශ්‍රී.ලං.ප.සේ III | 2012.09.24 |
| 04 | වයි.අයි.ඩී.ගුණවර්ධන මෙය | ශ්‍රී.ලං.ප.සේ III | 2012.09.24 |
| 05 | පී.ඒ.මධුශංක මයා | ශ්‍රී.ලං.ප.සේ III | 2012.09.24 |
| 06 | එම්.එල්.එන්.සඳමාලි මිය | ශ්‍රී.ලං.ප.සේ III | 2012.09.24 |
| 07 | ඩබ්.එම්.ඩී.කේ.වික්‍රමසිංහ මයා | ශ්‍රී.ලං.ප.සේ III | 2012.09.24 |
| 08 | ආර්.එම්.ජී.සී.ඒ.මැණිකේ මිය | ශ්‍රී.ලං.ප.සේ III | 2012.09.24 |
| 09 | එම්.සී.මලවිආරච්චි මෙය | ශ්‍රී.ලං.ප.සේ III | 2012.09.24 |

සී.ටී.එම්.වී.එච්.ජයසිරි මයා 2012.09.24 දින සේවයට වාර්තා කළ අතර 2012.10.01 දින දක්වා පමණක් සේවය කර ඇත.

❖ **ශ්‍රී.ලං.ඉං. සේවයේ නව පත්වීම්**

| අනු අංකය | නිලධාරියාගේ නම | සේවය | අනුයුක්ත දිනය |
|---|---|---|---|
| 01 | රියාසත් අලි මයා | ශ්‍රී.ලං.ඉං.සේ III | 2012.05.28 |

❖ **රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය**

2010 වර්ෂයේ පවත්වන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට බඳවා ගැනීම සඳහා පවත්වන ලද විභාගයේ ප්‍රතිඵල මත රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිලධාරීන් බඳවා ගත් අතර ඉන් නිලධාරීන් 23 දෙනෙකු සමාලෝචන වර්ෂය තුළ දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී.

❖ **රියදුරු සේවය**

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් විධිමත් පත්වීම් ලිපි නිකුත් කරන තුරු සමාලෝචන වර්ෂය තුළ රියදුරන් 9 දෙනෙකු අමාත්‍යාංශය මඟින් බඳවා ගෙන මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී.

## (III) පත්වීම් ස්ථිර කිරීම

සමාලෝචන වර්ෂය තුළ කෘ.ප.නි.ස නිලධාරීන්ගේ ප්‍රතිඵල ලේඛන විභාග දෙපාර්තමේන්තුව මඟින් සනාථ කරවා ගෙන අදාල පත්වීම් ස්ථිර කිරීමට කටයුතු කරන ලදී.

## (IV) තනතුර අතහැර යාම, ඉල්ලා අස්වීම, මියයාම් හා වැඩ තහනම් කිරීම්

සමාලෝචන වර්ෂය තුළ සිදුවූ වෙනස්කම් පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | සේවය හැර යාම | ඉල්ලා අස්වීම | මියයාම් | මුදාහැරීම | වැඩ තහනම් |
|---|---|---|---|---|---|---|
| 01 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 2 | 1 | | 4 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 02 | රියදුරු සේවය | - | - | 1 | - | |
| 03 | කාර්යාල සේවක සේවය | 2 | - | - | - | |
| 04 | කෘ.ප.නි.ස. | | | | | 03 |
| 05 | කම්වු ලිපිකරු | | | | | 01 |
| 06 | ගො.සං.නි. | | | | | 04 |

**(V) ස්ථාන මාරුවීම්**

දීප ව්‍යාප්ත සේවාවන් හැරුණු විට ඒකාබද්ධ සේවාවල නිළධාරීන්ගේ ස්ථාන මාරුවීම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | ස්ථාන මාරුවී ගිය සංඛ්‍යාව | පැමිණි සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 69 | 59 |
| 02 | රියදුරු සේවය | 04 | 04 |

**(VI) විශ්‍රාම ගැනීම්**

සමාලෝචන වර්ෂය තුළ විශ්රාම ගැනීම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | විශ්‍රාම ගිය සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | වි.වැ.2.17 වගන්තියෙන් | වි.වැ.2.12 වගන්තියෙන් |
| 01 | ශ්‍රී.ලං.ප.සේ | 02 | |
| 02 | රා.ක.සේ | 19 | |
| 03 | රියදුරු | 02 | |
| 04 | කා.ක.ස | 02 | |
| 05 | කම්වු ලිපිකරු | 21 | 01 |
| 06 | කෘ.ප.නි.ස | 02 | |
| 07 | කාර්මික නිලධාරී | 04 | |
| 08 | ගොවිජන සංවර්ධන නිලධාරී | 19 | 05 |
| 09 | ලඝු යතුරු | 01 | |

## **1.1.4**. කාර්යක්ෂමතා කඩඉම.

සමාලෝචන වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ පැවැත්වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| තනතුර | පැවැත්වූ දිනය |
|---|---|
| ඉංජිනේරු සේවා | 2012.12.15 |
| කම්වු ලිපිකරු | 2012.12.01 } ප්‍රතිඵල නිකුත් කිරීම පිළිබඳ කටයුතු ඉදිරි |
| කෘ.ප.නි.ස | 2012.12.22 } වර්ෂයේදී සිදු කිරීමට නියමිතව ඇත. |

| | |
|---|---|
| රියදුරු | 2012.02.23 දින පැවැත්වූ අතර 2012.03.22 ප්‍රතිඵල නිකුත් කරන ලදී |
| කා.ක.ස | 2012.02.23 දින පැවැත්වූ අතර 2012.03.12 ප්‍රතිඵල නිකුත් කරන ලදී<br>2012.12.13 පැවැත්වූ අතර 2012.12.20 දින ප්‍රතිඵල නිකුත් කරන ලදී |

### 1.1.5. විදේශ සංචාර හා පුහුණු.

සමාලෝචන වර්ෂය තුළදී විදේශ ශිෂ්‍යත්ව සම්මේලන වැඩමුලු වලටසහභාගි වීම පරිදි වේ.

- 2012.11.05 දින සිට 2012.11.16 දින දක්වා තායිලන්තයේ පැවැත්වූ Environmental Based Land Use Planning For Global Warming Mitigation and Sustainable Development at Faculty of Environmental Management Songkig University During 5 – 16 of November 2012, පුහුණු වැඩමුළුවට කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර පී.එම්.ඩී.මුණසිංහ මිය සහභාගී විය.

- 2012.07.01 දින සිට 2012.08.25 දින දක්වා Participation of SLAS Officers in the Phase III Programme for Indian Administrative Service (IAS) Officers in Lal Bahadur Shastri national Academy of Administraion (LBSNAA) India වැඩ සටහනට ආර්.රුෂාන්දන් මහතා සහභාගී විය.

- 2012.02.12 දින සිට 2012.02.18 දින දක්වා චීනයේ පැවැත්වූ යාන්ත්‍රික පුහුණුව සඳහා යාන්ත්‍රික අධිකාරි ආනන්ද වීරවංශ මහතා හා මහේෂ් ගුණසේකර මහතා සහභාගි විය.

### 1.1.6. විනය කටයුතු.

සමාලෝචන වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ විධිමත් විනය පරීක්ෂණ ආරම්භ කර ඇති සංඛ්‍යාව 44කි. චෝදනා පත්‍ර නිකුත් කිරීමට ඇති විනය පරීක්ෂණ ගණන 14කි. විධිමත් විනය පරීක්ෂණ අවසන් කර විනය නියෝග නිකුත් කිරීමට ඇති ප්‍රමාණය 05කි. සමාලෝචන වර්ෂය තුළදී විධිමත් විනය පරීක්ෂණ අවසන් කර විනය නියෝග නිකුත් කර ඇති ප්‍රමාණය 65කි.

### 1.1.7. පුහුණු හා හැකියා වර්ධන.

සමාලෝචන වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කුසලතා, ආකල්ප හා දැනුම වර්ධනය කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ. මේ සඳහා රු.2,250,000/- ක් වෙන්වී තිබූ අතර වර්ෂය අවසාන වන විට රු.2356228.62 ක් වැයකර තිබුණි.

| අනු අංකය | පුහුණු විෂය | පුහුණු කළ නිලධාරින් | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | කෘ.ප.නි.ස.වරුන්ගේ විෂය පථය | මන්නාරම දිස්ත්‍රික්කයට අනුයුක්ත කෘ.ප.නි.ස. නිලධාරීන් | 50 |
| 02 | කාර්යාල කටයුතු ප්‍රතිසංවිධානය කිරිමේ පුහුණු වැඩමුළුව | ආයතන සංවර්ධන, ගොවි බැංකු, එළදා අලෙවිහා නීති අංශයේ සියළුම නිලධාරීන් | 60 |

| | | | |
|---|---|---|---|
| 03 | නීති පිළිබඳ පුහුණු වැඩමුළුව | ගම්පහදිස්ත්‍රික්කයට අනුයුක්ත ගො.සං. නිලධාරීන් හා කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ ගො.සං. නිලධාරීන් | 45 |
| 04 | නීති පිළිබඳ පුහුණු වැඩමුළුව | බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවලට අනුයුක්ත ගො.සං.නිලධාරීන් | 47 |
| 05 | ගො.සේ.ම.ගිණුම් කටයුතු පුහුණුව | කිලිනොච්චිය දිස්ත්‍රික් කාර්යාලයට අනුයුක්ත කම්වු ලිපිකරුවන් හා අලෙවි ලිපිකරුවන් | 16 |
| 06 | ගො.සේ.ම.ගිණුම් කටයුතු පුහුණුව | කළුතර දිස්ත්‍රික්කයට අනුයුක්ත ගො.සං.නිලධාරින් හා කම්වු ලිපිකරුවන් | 50 |
| 07 | ගො.සේ.ම.ගිණුම් කටයුතු පුහුණුව | මාතර දිස්ත්‍රික්කයට අනුයුක්ත ගො.සං.නිලධාරින් හාකම්වු ලිපිකරුවන් | 55 |
| 08 | සේවාරම්භක පුහුණුව | නවක ගො.සං.නිලධාරින් | 50 |
| 09 | ගො.සේ.ම.ගිණුම් කටයුතු පුහුණුව | පොළොන්නරුව දිස්ත්‍රික්කයට අනුයුක්ත ගො.සං.නිලධාරින් හා කම්වු ලිපිකරුවන් | 25 |
| 10 | ගො.සේ.ම.ගිණුම් කටයුතු පුහුණුව | කොළඹදිස්ත්‍රික්කයටඅනුයුක්තගො.සං. නිලධාරින් හාකම්වු ලිපිකරුවන් | 50 |
| 11 | විශ්‍රාම කටයුතු පුහුණුව | දිස්ත්‍රික් කාර්යාලවල තෝරාගත් රා.ක.ස. නිලධාරීන් | 55 |
| 12 | දෙපාර්තමේන්තු කටයුතු පුහුණුව | නවක සහකාර කොමසාරිස්වරුන් ඇතුළු තෝරාගත් නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් | 30 |
| 13 | විනය කටයුතු පුහුණුව | තෝරාගත් දිස්ත්‍රික්ක 10ක රා.ක.ස. නිලධාරීන් | 60 |
| 14 | 2012 බඳවා ගත් උපාධිධාරී පුහුණුව | ගම්පහ දිස්ත්‍රික් උපාධිධාරී අභ්‍යාසලාභීන් | 50 |
| 15 | ආයතන කටයුතු හා කාර්යාල කළමනාකරණ පුහුණු වැඩමුළුව | මාතර,ගාල්ල,හම්බන්තොට ගො.සේ.ම. ලිපිකරුවන් | 60 |
| 16 | 2012 බඳවා ගත් උපාධිධාරී පුහුණුව | ගාල්ල දිස්ත්‍රික් උපාධිධාරී අභ්‍යාසලාභීන් | 36 |
| 17 | 2012 බඳවා ගත් උපාධිධාරී පුහුණුව | රත්නපුර දිස්ත්‍රික් උපාධිධාරී අභ්‍යාසලාභීන් | 55 |
| 18 | 2012 බඳවා ගත් උපාධිධාරී පුහුණුව | කළුතර දිස්ත්‍රික් උපාධිධාරී අභ්‍යාසලාභීන් | 90 |
| 19 | 2012 බඳවා ගත් උපාධිධාරී පුහුණුව | අනුරාධපුර දිස්ත්‍රික් උපාධිධාරී අභ්‍යාසලාභීන් | 160 |
| 20 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව | දිස්ත්‍රික් සහකාර කොමසාරිස්වරුන් හා තෝරාගත් නිලධාරීන් | 80 |
| 21 | රියදුරු කාර්යය සාධන පුහුණුව | දිස්ත්‍රික් කාර්යාලවල තෝරාගත් රියදුරු කාර්යය මණ්ඩලය | 35 |
| 22 | 2012 බඳවා ගත් උපාධිධාරී පුහුණුව | මාතර දිස්ත්‍රික් උපාධිධාරී අභ්‍යාසලාභීන් | 42 |
| 23 | වැටුප් සැකසීමේ පුහුණු පාඨමාලාව හැඳින්වීම සඳහා | ශ්‍යාමලි ආරියවංශ මිය- ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය | - |
| 24 | 2012 බඳවා ගත් උපාධිධාරී පුහුණුව | මොණරාගල දිස්ත්‍රික් උපාධිධාරී අභ්‍යාසලාභීන් | |

| | | | |
|---|---|---|---|
| 25 | 2012 බඳවා ගත් උපාධිධාරී පුහුණුව | කුරුණෑගල දිස්ත්‍රික් උපාධිධාරී අභ්‍යාසලාභීන් | 220 |
| 26 | 2012 බඳවා ගත් උපාධිධාරී පුහුණුව | මහනුවර දිස්ත්‍රික් උපාධිධාරී අභ්‍යාසලාභීන් | |
| 27 | විනය කටයුතු පුහුණුව | දිස්ත්‍රික්ක කාර්යාලවල විෂය භාර නිලධාරීන් | 50 |
| 28 | දෙමළ මූලික පාඨමාලාව හැදෑරීම සඳහා | කේ.ඒ.එස්.සමරජීව මිය(ස.කො.-පාලන)-ප්‍රධාන කාර්යාලය | - |
| 29 | ප්‍රසම්පාදන ඩිප්ලෝමා පාඨමාලාව | කේ.කේ.එම්.සී.කුලරත්න මිය | - |
| 30 | දෙමළ මූලික පාඨමාලාව හැදෑරීම සඳහා | එම්.ඒ.අයි.එස්.මහනාම මිය (ස.කො./මුදල් -සැපයීම්)-ප්‍රධාන කාර්යාලය | - |
| 31 | පරිගණක පාඨමාලාවක් හැදෑරීම | පී.ඒ.ඒ.වීරවංශ මයා (සහකාර කොමසාරිස්-යාන්ත්‍රික) | - |
| 32 | විධායක ඩිප්ලෝමා පාඨමාලාව - කො/වි (සේවා සංස්කරණය පිළිබඳ) | පී.එස්.බණ්ඩාර මිය (ස.කො-ගම්පහ) | - |
| 33 | රාජ්‍ය සේවා පුහුණු ආයතනයේ පුහුණුවලට සහභාගි වීම වෙනුවෙන් සහභාගිත්ව දීමනා ලබා ගැනීම | රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | - |
| 34 | ස්ථාවර වත්කම් කළමනාකරණ මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමේ පුහුණු වැඩමුළුව | ප්‍රධන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලවල විෂය භාර නිලධාරීන් | 50 |
| 35 | භාණ්ඩ සමීක්ෂණ වට්ටෝරු පොත, භාණ්ඩ අපහරණය සම්බන්ධ පුහුණුව | මධ්‍යස්ථාන ලිපිකරුවන් හා දිස්ත්‍රික් කාර්යාලයේ කාර්ය මණ්ඩලය | 50 |

## 1.1.8. සාකච්ඡා.

සමාලෝචන වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්, දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් හා දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වූ සාකච්ඡා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | සාකච්ඡා වර්ගය | පැවැත් වූ ස්ථානය | පැවැත් වූ දිනය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | මාණ්ඩලික නිලධාරී සාකච්ඡාව | කැළණිය, විශ්‍රාමික නිවාඩු නිකේතනය | 2012.01.26 හා 2012.01.27 | 100 |
| 02 | මාණ්ඩලික නිලධාරී සාකච්ඡාව | සේවා සංස්කරණ ආයතනය - මහඉලුප්පල්ලම | 2012.02.13 හා 2012.02.14 | 100 |
| 03 | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම | ප්‍රධාන කාර්යාලය | 2012.01.12 | 35 |
| 04 | ගො.සං.නවක නිලධාරීන් සඳහා පත්වීම් ලිපි ප්‍රදානය | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 2012.03.01 | 75 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | මාණ්ඩලික නිලධාරී සාකච්ඡාව | ප්‍රධාන කාර්යාලය | 2012.03.05 | 70 |
| 06 | මාණ්ඩලික නිලධාරී සාකච්ඡාව | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පුහුණු ආයතනය | 2012.05.03 හා 2012.05.04 | 110 |
| 07 | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම | ප්‍රධාන කාර්යාලය | 2012.04.24 | 35 |
| 08 | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම | ප්‍රධාන කාර්යාලය | 2012.05.28 | 35 |
| 09 | මාණ්ඩලික නිලධාරී සාකච්ඡාව | ප්‍රධාන කාර්යාලය | 2012.06.06 | 20 |
| 10 | මාණ්ඩලික නිලධාරී සාකච්ඡාව | පොතුහැර, ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය | 2012.06.14 | 100 |
| 11 | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම | ප්‍රධාන කාර්යාලය | 2012.07.12 | 35 |
| 12 | කෘ.ප.නි.ස.වෘත්තීය ගැටළු පිළිබඳ සාකච්ඡාව | ප්‍රධාන කාර්යාලය | 2012.07.19 | 40 |
| 13 | තැන්පත් ගිණුම් සැසඳීම්,වැටුප් පිළියෙල කිරීමේ වැඩමුළුව | ප්‍රධාන කාර්යාලය | 2012.07.26 | 125 |
| 14 | දිවි නැගුම සාකච්ඡාව | ප්‍රධාන කාර්යාලය | 2012.08.10 | 110 |
| 15 | ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමේ වැඩමුළුව | ප්‍රධාන කාර්යාලය | 2012.08.23 | 200 |
| 16 | ගංගා ආශ්‍රිත උණ වගා කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචන රැස්වීම | ප්‍රධාන කාර්යාලය | 2012.08.20 | 15 |
| 17 | මාතර දිස්ත්‍රික් ගොවි සංවිධාන සාකච්ඡාව | ප්‍රධාන කාර්යාලය | 2012.08.08 | 15 |
| 18 | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම | ප්‍රධාන කාර්යාලය | 2012.09.18 | 45 |
| 19 | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම | ප්‍රධාන කාර්යාලය | 2012.10.22 | 45 |
| 20 | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම | ප්‍රධාන කාර්යාලය | 2012.11.21 | 45 |
| 21 | ගොවිජන සේවා කමිටු කාරක සභා වල ආදායම් තත්ත්වය වර්ධනය කර ගැනිම සඳහා වු සාකච්ඡාව | ප්‍රධාන කාර්යාලය | 2012.11.15 | 15 |
| 22 | මාණ්ඩලික නිලධාරී සාකච්ඡාව | පස්සර,කළමනාකරණ සංවර්ධන ආයතනය | 2012.11.29 හා 30 | 110 |
| 23 | ආයතන අංශයේ රාජකාරි කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කන්නෙලිය නිවාඩු නිකේතනය | 2012.12.28 හා 29 | 25 |
| 24 | ගො.සේ.ම.ලිපිකරුවන් බඳවා ගැනීම සඳහා වු පත්වීම් ලිපි ප්‍රදානය | ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය | 2013.01.02 | 45 |

**1.1.9. සමාලෝචන වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ අරමුණු ලඟා කර ගැනීම උදෙසා තම දායකත්වය ලබා දුන් දීප ව්‍යාප්ත සේවාවන්වල නිලධාරීන් පහත දක්වා ඇත.**

| අනු අංකය | නිලධාරියාගේ නම | ශ්‍රේණිය | අනුයුක්ත කාර්යාලය | තනතුර |
|---|---|---|---|---|
| | **ශ්‍රී ලංකා පරිපාලන සේවය** | | | |
| 01 | එම්.ඒ.එස්.වීරසිංහ මහතා | ශ්‍රී.ලං.ප.සේ. විශේෂ | ප්‍ර. කාර්යාලය | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් |
| 02 | සුමිත්‍රා කන්නන්ගර මිය | ශ්‍රී.ලං.ප.සේ. විශේෂ | ප්‍ර. කාර්යාලය | අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් |
| 03 | චන්දන කුමාරසිංහ මහතා | ශ්‍රී.ලං.ප.සේ. i | ප්‍ර. කාර්යාලය | කොමසාරිස් (මා.ස.සං) |
| 04 | එස්.ඩී.කේ.ප්‍රනාන්දු මයා | ශ්‍රී.ලං.ප.සේ. i | ප්‍ර. කාර්යාලය | කොමසාරිස් (සේවා) |
| 05 | හේමන්ත ගමගේ මහතා | ශ්‍රී.ලං.ප.සේ. i | ප්‍ර. කාර්යාලය | කොමසාරිස් (සංවර්ධන) |
| 06 | කේ.ඒ.එස්.සමරජීව මිය | ශ්‍රී.ලං.ප.සේ. iii | ප්‍ර. කාර්යාලය | සහකාර කොමසාරිස්(පාලන) |
| 07 | එම්.ඊ.වීරසිංහ මෙය | ශ්‍රී.ලං.ප.සේ. iii | ප්‍ර. කාර්යාලය | සහකාර කොමසාරිස්(සේවා) |
| 08 | වයි.අයි.ඩී.ගුණවර්ධන මෙය | ශ්‍රී.ලං.ප.සේ. iii | ප්‍ර. කාර්යාලය | සහකාර කොමසාරිස් (සංවර්ධන) |
| 09 | එම්.එල්.එන්.සඳමාලි මිය | ශ්‍රී.ලං.ප.සේ. iii | ප්‍ර.කාර්යාලය | සහකාර කොමසාරිස් (ආයතන) |
| 10 | එස්.එම්.එම්.විජිතා මායාදුන්නේ මිය | ශ්‍රී.ලං.ප.සේ. iii | ප්‍ර.කාර්යාලය | නියෝජ්‍ය කොමසාරිස් (සේවා) - වැ.බ |
| 11 | ආර්. රුෂාන්දන් මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | මඩකලපුව | සහකාර කොමසාරිස් |
| 12 | බී.එන්.ඩී.කුමාර මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | අම්පාර | සහකාර කොමසාරිස් |
| 13 | එම්. පැට්‍රික් ධිරන්ජන් මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | යාපනය | සහකාර කොමසාරිස් |
| 14 | ඩී.එම්.ජී.බී.දිසානායක මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | කුරුණෑගල | සහකාර කොමසාරිස් |
| 15 | එස්.එම්.ඩී.සී.සමරසේකර මහතා (2012.01.04 සිට වසර 2ක් විදේශගත) | ශ්‍රී.ලං.ප.සේ. iii | බදුල්ල | සහකාර කොමසාරිස් |
| 16 | ඩී.එල්.කේ.ප්‍රියවංශ මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | හම්බන්තොට | සහකාර කොමසාරිස් |
| 17 | කේ.එල්.එම්.සී.කුලරත්න මිය | ශ්‍රී.ලං.ප.සේ. i | මහනුවර | නියෝජ්‍ය කොමසාරිස් |
| 18 | ඊ.තයාරුපන් මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | කිලිනොච්චිය | සහකාර කොමසාරිස් |
| 19 | එස්.පුනිදකුමාර් මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | ත්‍රිකුණාමලය | සහකාර කොමසාරිස් |
| 20 | එම්.යූ.නිශාන්ත මයා | ශ්‍රී.ලං.ප.සේ. iii | පොළොන්නරුව | සහකාර කොමසාරිස් |
| 21 | ඒ.එම්.ආරිෆ් මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | කළුතර | සහකාර කොමසාරිස් |
| 22 | එන්.පී.අමරතුංග මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | කොළඹ | සහකාර කොමසාරිස් |
| 23 | ආර්.එම්.කේ.ආර්.බී. රත්නායක මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | අනුරාධපුරය | සහකාර කොමසාරිස් |
| 24 | ඉසෙඩ්.ඒ.එම්.ෆයිසාල් මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | කෑගල්ල | සහකාර කොමසාරිස් |
| 25 | ජේ.ඩී.එන්.එස්.ජයකොඩි මයා | ශ්‍රී.ලං.ප.සේ. iii | රත්නපුර | සහකාර කොමසාරිස් |
| 26 | පී.ජී. සෝමරත්න මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | මාතලේ | සහකාර කොමසාරිස් |
| 27 | කේ.සුලෝජනී මිය | ශ්‍රී.ලං.ප.සේ. iii | වවුනියාව | සහකාර කොමසාරිස් |
| 28 | ඒ.එම්.පී.පතිරගේ මයා | ශ්‍රී.ලං.ප.සේ. iii | ගම්පහ | සහකාර කොමසාරිස් |
| 29 | ආර්.පී.ජී.පොඩිනෝරිස් මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | හලාවත | සහකාර කොමසාරිස් |

| | | | | |
|---|---|---|---|---|
| 30 | එන්.ජී.එම්.එස්.කුමාර මහතා | ශ්‍රී.ලං.ප.සේ. iii | නුවරඑළිය | සහකාර කොමසාරිස් |
| 31 | ජී.ඩී.ඒ.ස්වර්ණලතා මිය | ශ්‍රී.ලං.ප.සේ. iii | කුරුණෑගල | නියෝජ්‍ය කොමසාරිස් |
| 32 | ඩී.එච්.ඩී.ශ්‍යාමලී මිය | ශ්‍රී.ලං.ප.සේ. iii | මාතර | සහකාර කොමසාරිස් |
| 33 | පී.කොඩිතුවක්කු මිය | ශ්‍රී.ලං.ප.සේ. iii | ගාල්ල | සහකාර කොමසාරිස් |

| අනු අංකය | නිලධාරියාගේ නම | ශ්‍රේණිය | අනුයුක්ත කාර්යාලය | තනතුර |
|---|---|---|---|---|
| | **ගණකාධිකාරි සේවය** | | | |
| 01 | ඩබ්.එම්.එම්.බී.එච්.ගුණරත්න මහතා | ශ්‍රී.ලං.ග.සේ. i | ප්‍ර.කාර්යාලය | කොමසාරිස් (මුදල්) |
| 02 | රේණුකා කොළඹගේ මිය | ශ්‍රී.ලං.ග.සේ. ii | ප්‍ර.කාර්යාලය | ප්‍රධානඅභ්‍යන්තර විගණක |
| 03 | එම්.ඒ.අයි.එස්. මහානාම මිය | ශ්‍රී.ලං.ග.සේ. iii | ප්‍ර.කාර්යාලය | සහකාර කොමසාරිස් (මුදල්) |
| 04 | එම්.පී.කේ. ජයතුංග මෙය | ශ්‍රී.ලං.ග.සේ. iii | ප්‍ර.කාර්යාලය | සහකාර කොමසාරිස් (මුදල්) |
| 05 | ටී.ඒ.ඩබ්. නාරායන මෙය | ශ්‍රී.ලං.ග.සේ. iii | ප්‍ර.කාර්යාලය | සහකාර කොමසාරිස් (මුදල්) |
| | **ඉංජිනේරු සේවය** | | | |
| 01 | ටී.එස්. විජේවර්ධන මහතා | ශ්‍රී.ලං.ඉ.සේ. i | ප්‍ර.කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු |
| 02 | ඩී.ඩී. ප්‍රභාත් විතාරණ මහතා | ශ්‍රී.ලං.ඉ.සේ. iii | ප්‍ර.කාර්යාලය | වාරි කළමණාකරණ ඉංජිනේරු |
| 03 | ආර්.එම්.යූ. රත්නායක මහතා | ශ්‍රී.ලං.ඉ.සේ. i | කුරුණෑගල | ප්‍රාදේශීය ඉංජිනේරු |
| 04 | කේ.එම්.බී. කැඳරගම මහතා | ශ්‍රී.ලං.ඉ.සේ. i | මහනුවර | ප්‍රාදේශීය ඉංජිනේරු |
| 05 | රියාසත් අලි මහතා | ශ්‍රී.ලං.ඉ.සේ. iii | මඩකලපුව | ප්‍රාදේශීය ඉංජිනේරු |
| 06 | වසන්ත අමරආරච්චි මහතා | ශ්‍රී.ලං.ඉ.සේ. iii | වව්නියාව | ප්‍රාදේශීය ඉංජිනේරු |
| 07 | එම්.ජී.කේ.ප්‍රියශාන්ත මයා | ශ්‍රී.ලං.ඉ.සේ. iii | හම්බන්තොට | ප්‍රාදේශීය ඉංජිනේරු |
| 08 | එම්.එම්. මුනාස් මහතා | ශ්‍රී.ලං.ඉ.සේ. iii | මඩකලපුව | ප්රාදේශීය ඉංජිනේරු |
| 09 | බී.එම්.ආර්.එස්.ආර්. සෙනෙවිරත්න මිය | ශ්‍රී.ලං.ඉ.සේ. iii | රත්නපුරය | ප්‍රාදේශීය ඉංජිනේරු |
| 10 | එම්.ජිනදාස මහතා | ශ්‍රී.ලං.ඉ.සේ. iii | බදුල්ල | ප්‍රාදේශීය ඉංජිනේරු |

## 1.1.10. දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරුන් පිළිබඳ විස්තර.

| අනු අංකය | නම | සේවා ස්ථානය |
|---|---|---|
| 01 | ඩබ්.ඒ.අයි.පෙරේරා මහතා | කුරුණෑගල |
| 02 | එස්.ඒ.ඩබ්.සමරසිංහ මහතා | මහනුවර |
| 03 | ඩබ්.එම්.එම්.බී.පහලගිරිබාව මහතා | අනුරාධපුරය |

# 1.2 පාලන අංශය.

පාලන අංශය මගින් ඉටු කරනු ලබන ප්‍රධානම සේවාව වනුයේ දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම සාමාන්‍ය ලිපි , ලියාපදිංචි ලිපි හා චෙක්පත් ඒ ඒ අංශ වෙත යොමු කිරීම සහ ඒ ඒ අංශ වලින් ලැබෙන සියලුම ලිපි අදාල ආයතන හා පුද්ගලයින් වෙත යැවීමට කටයුතු කිරීමයි.

ඊට අමතරව පහත සඳහන් සේවාවන්ද පාලන අංශය මගින් ඉටුකරනු ලබයි.

- දෙපාර්තමේන්තුවේ ආරක්ෂක හා පවිත්‍රතා කටයුතු පවත්වාගෙන යෑම.
- දෙපාර්තමේන්තුවේ සියලුම දුරකථන බිල්පත් , විදුලි බිල්පත්, ජල බිල්පත් පියවීම හා වරිපනම් ගාස්තු ගෙවීම.
- දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සියලුම නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ රාජකාරී.
- ගොවිජන සේවා හා වනජීවී කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට අදාල ලිපි සම්බන්ධීකරණය කිරීම.
- දෙපාර්තමේන්තු අභ්‍යන්තර දුරකථන පද්ධතියේ නඩත්තු කටයුතු සිදු කිරීම.
- නිල නිවාස කුලී අය කිරීම.
- නිලධාරීන්ගේ ඇප තැන්පත් මුදල් ආපසු ගෙවීම.
- දෙපාර්තමේන්තුව වෙත මිල දී ගනු ලබන පුවත්පත් සම්බන්ධ සියලුම රාජකාරි.
- දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සඳහා දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබාදීම.
- දුම්රිය බලපත්‍ර ලබා දීම.
- පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න හා සම්බන්ධ ලිපි සම්බන්ධීකරණය කිරීම.
- මහජන පෙත්සම් කාරක සභාව හා සම්බන්ධ ලිපි සම්බන්ධීකරණය කිරීම.
- පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අදාල ලිපි පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු.

# 2. සංවර්ධන හා ප්‍රගති පාලන අංශය

## 2.1 පුරන් කුඹුරු අස්වැද්දීම - වැය ශීර්ෂය 281-2-2-10-2502

පුරන් කුඹුරු අස්වැද්දීම යටතේ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම රු.මි.254.5 කි. එයින් රු.මි.196.5 ක් පුරන් කුඹුරු ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද අතර දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි සිදු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 218 කි. මේ යටතේ අලුතින් වගා කෙරුණු අක්කර ප්‍රමාණය 4271 කි. ප්‍රතිලාභී ගොවි පවුල් ගණන 8428 ක් ද වියදම රු.මි. 107.9 ක් ද විය.
ඉතිරි රු. මි. 58 ජල කළමනාකරණ අංශය යටතේ පහත සඳහන් ව්‍යාපෘති සඳහා වැය කර ඇත.
**ඇමුණුම 01**

**01. එල්ලංගා වැව් අලුත්වැඩියා කිරීමේ වැඩසටහන**
මේ යටතේ කර්මාන්ත 3 ක් සඳහා රු.මි.18 ක් වෙන් කර ඇත.
**ඇමුණුම 02**

**02. වැව් ගැඹුරු කිරීමේ වැඩසටහන**
මේ යටතේ කර්මාන්ත 20 ක් වෙනුවෙන් වෙන් වී ඇති මුදල රු.මි. 20 කි.
**ඇමුණුම 03**

**03. භාණ්ඩ හා සේවා සපයා ගැනීම**
මේ සඳහා රු.මි.20 ක වියදමක් දරා ඇත.
**ඇමුණුම 04**

## 2.2 ගොඩනැගිලි පුනරුත්ථාපනය (ගොවිජන සේවා මධ්‍යස්ථාන)
**වැය ශීර්ෂය - 281-2-2-0-2001**

ගොවිජන සේවා මධ්‍යස්ථාන පුනරුත්ථාපනය සඳහා රු.මි. 100 ක් වෙන් කර තිබූ අතර ඉන් රු.මි. 50 ක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන දැයට කිරුළ වැඩසටහන වෙනුවෙන් වෙන් කරන ලදී. ඉතිරි රු.මි. 50 යටතේ යාපනය, මහනුවර, කොළඹ, මඩකලපුව, මාතලේ, ත්‍රිකුණාමලය, මාතර, ගම්පහ, කළුතර, ගාල්ල, නුවරඑළිය, කුරුණෑගල, අම්පාර, වවුනියාව, කෑගල්ල, රත්නපුර, හම්බන්තොට, පොළොන්නරුව, පුත්තලම, මොණරාගල, මුලතිව්, මන්නාරම, බදුල්ල, කිලිනොච්චිය දිස්ත්‍රික්ක වලට අදාල මධ්‍යස්ථාන 59 ක අලුත්වැඩියා කටයුතු ඉටුකර ඇත. මේ සියලුම ව්‍යාපෘති සඳහා රු.මි. 75.74 ක වියදමක් දරා ඇත.
**ඇමුණුම 05**

## 2.3 ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල වල අලුත්වැඩියාවන්
**වැය ශීර්ෂය - 281-1-1-0-2001**

ඉහත වැය ශීර්ෂය යටතේ වෙන්වූ ශුද්ධ ප්‍රතිපාදන රු.මි. 20.085 ක මුදලින් ප්‍රධාන කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු, නාරාහේන්පිට ගබඩා සංකීර්ණය, මාලබේ යන්ත්‍රාගාරය අලුත්වැඩියා කිරීම හා කුරුණෑගල, යාපනය, අනුරාධපුරය, මාතලේ, හම්බන්තොට, පුත්තලම, කළුතර, බදුල්ල, වවුනියාව, මොණරාගල දිස්ත්‍රික් කාර්යාල වල අලුත්වැඩියාවන් සිදු කර ඇති අතර මේ සඳහා රු.මි. 18.644 ක වියදමක් දරා ඇත.

## 2.4 ගොඩනැගිලි ඉදිකිරීම්
**වැය ශීර්ෂය 281 -2-2-0-2104(02)**

මේ සඳහා රු.මි. 40 ක් වෙන්කර තිබූ අතර මාතර දිස්ත්‍රික්කයේ සුනාමියෙන් හානියට පත් තලල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ද හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයේ දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සාලියපුර හා මිහින්තලය ගො.සේ.ම ඉදිකිරීම, අම්පාර දිස්ත්‍රික්කයේ පානම ගො.සේ.ම ඉදිකිරීම හා බදුල්ල දිස්ත්‍රික්කයේ රඹුක්පොත ගො.සේ.ම ඉදිකිරීම සිදු කර ඇත. තවද පොහොර ගබඩා සඳහා 2011 වසරේ නොගෙවූ බිල්පත් වල වියදම් ද ඇතුළුව රු.මි. 21.061 ක වියදමක් දරා ඇත.

## 2.5 පොහොර ගබඩා ඉදිකිරීම - වැය ශීර්ෂය 281-2-2-8-2104

පොහොර ගබඩා ඉදිකිරීම වෙනුවෙන් රු.මි. 2.6 ක ප්‍රතිපාදන වෙන් වූ අතර දිස්ත්‍රික්ක 08 ක් වෙනුවෙන් (මාතලේ, ගාල්ල, පුත්තලම, කුරුණෑගල, මාතර, කෑගල්ල, , හම්බන්තොට, අනුරාධපුර) රු.මි 2.59 ක් වියදම් දරා ඇත.

## 2.6 ගොඩනැගිලි නඩත්තු (දිස්ත්‍රික් කාර්යාල) - වැය ශීර්ෂය 281-1-1-0-1303

ඉහත වැය ශීර්ෂය යටතේ ගොඩනැගිලි නඩත්තු කිරීම (දි.කා) සඳහා වෙන්වූ ශුද්ධ ප්‍රතිපාදන රු.305,000.00 ක මුදලින් ප්‍රධාන කාර්යාලය ඇතුළු මොණරාගල, මහනුවර, හම්බන්තොට, පුත්තලම, කෑගල්ල යන දිස්ත්‍රික්ක වල ගොඩනැගිලි නඩත්තුව සඳහා රු.301,090.40 ක වියදමක් දරා ඇත.

## 2.7 ගොඩනැගිලි නඩත්තු (ගො.සේ.ම) - වැය ශීර්ෂය 281-2-2-0-1303

ඉහත වැය ශීර්ෂය යටතේ ගොඩනැගිලි නඩත්තු කිරීම (ගො.සේ.ම) සඳහා වෙන්වූ ශුද්ධ ප්‍රතිපාදන රු.288,000.00 ක මුදලින් කොළඹ, මහනුවර, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල ගොඩනැගිලි නඩත්තුව සඳහා රු.281,650.50 ක වියදමක් දරා ඇත.

## 2.8 සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය

මෙම දෙපාර්තමේන්තුව ආරම්භයේදී සිටම සුලු වාරිමාර්ග පුනරුත්තාපනය මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් විය. 2000 ග්‍රාමීය වාරිමාර්ග සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාව පුරා වැව් 11257 ක්ද අමුණු 12942 ක්ද ඇත. මෙයට සම්බන්ධ වාරිමාර්ග ප්‍රමාණය අති විශාලය. වී වගා කරන ගොවීන් වෙනුවෙන් මේවා නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පසුගිය වර්ෂ 50 ක කාලය තුළ ඉටුකරන ලදී.

## 2.9 ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන ලබා දුන් ව්‍යාපෘති

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මඟින් දෙපාර්තමේන්තුව හරහා ජාතික සවිය ගම නැගුම වැඩසටහන යටතේ කුරුණෑගල හා අනුරාධපුර දිස්ත්‍රික්ක වෙත රු.මි.221.61 ක් ව්‍යාපෘති 157 ක් වෙනුවෙන් වෙන් කරදී ඇත.ඊට අමතරව එක් ගමකට එක් වැඩක් සහ අනෙකුත් ව්‍යාපෘති සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් යටතේ දිස්ත්‍රික්ක සඳහා රු.මි.43.71 ප්‍රතිපාදන වෙන් කර දී ඇති අතර ඒ වෙනුවෙන් කර්මාන්ත 52 ක් ඉටුකර ඇත.

## 2.10 බාහිර ආයතන සමඟ කටයුතු

NECORD, World Food Program, Peace wind Japan, USAID, UNDP, OXFAM , GLZ ආදී සංවිධාන යටතේ කිලිනොච්චි , වව්නියා , මුලතිව් , යාපනය , ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල රු.මි. 66.67 ක ප්‍රතිපාදන යටතේ කර්මාන්ත 35 ක් ඉටුකර ඇත.

යළි පුබුදමු ව්‍යාපෘතිය යටතේ (RAP) ත්‍රිකුණාමලය ,වව්නියාව හා යාපනය දිස්ත්‍රික්ක සඳහා රු.මි. 226 ක් වෙනුවෙන් කර්මාන්ත 45ක් ඉටුකර ඇත.

## 2.11 ගොවීන්ගේ භාරකාර අරමුදල

ගොවීන්ගේ භාරකාර අරමුදල යටතේ දිස්ත්‍රික්ක 07 ක අවිච්ඡේද ව්‍යාපෘති 16ක් සඳහා රු.මි.21.32 ක් වෙන් වී ඇති අතර රු.මි.19.25 ක වියදමක් දරා ඇත. තවද නව කර්මාන්ත 93 ක් සඳහා ප්‍රතිපාදන වශයෙන් රු.මි.47.31 ක් වෙන් කරන ලද අතර ඒ සඳහා වන වියදම රු.මි.19.41 කි.

## 2.12 ගොවිජන සංවර්ධන අරමුදල

ගොවිජන සංවර්ධන අරමුදල යටතේ දිස්ත්‍රික්ක 06 ක ව්‍යාපෘති 6ක් සඳහා රු.මි. 3.68 ක ඇස්තමේන්තු ගත මුදලක් වෙනුවෙන් වූ අතර වියදම රු.මි.3.002කි.

## 2.13 අලුත් සහල් මංගල්‍යය (2012 අප්‍රේල් 03 – 04)

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වාර්ෂිකව පවත්වා ගෙන එන අලුත් සහල් මංගල්‍යය 45 වන වරටත් අනුරාධපුර විජය ශ්‍රී ජය ශ්‍රී මහ බෝධිය ඉදිරිපිට 2012 අප්‍රේල් 03 හා 04 දිනයන්හී පවත්වන ලදි.

මහා ගංවතුරකට පසු එළැඹෙන 45 වන අලුත් සහල් මංගල්‍ය අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට ලැබීම මහත් ආස්වාදයකි. අති ගරු ජනපතිතුමන් දිගුකාලීන යුද්ධය අවසන් කිරීමෙන් පසු පිබිදුණු දේශයේ ජනතා අපේක්ෂාවන් දින දින ලියමින් තිබේ. පශ්චාත් නන්දිකඩාල් අභිමානය ජනතා බලාපොරොත්තු සංවර්ධනයට යොමු කිරීමට මහින්ද චින්තනය ගත් වෙහෙස මල් ඵල දරයි. සමස්ථ දේශයේ කෘෂිකාර්මික සංවර්ධනය නොසිතූ පරිදි පුළුල් පරාසයකට විහිදෙද්දී ඊට එල්ලවන බාධාවන්ද නැතුවා නොවෙයි. දේශයට නිතර ඇද හැළුණු මහ වැසි ගම් බිම් යට කළා පමණක් නොව ගොවි ජනයා අතරමං භාවයටද පත් කළහ. එය දේශීය සහල් අස්වැන්නට මහත් සේ බලපෑවේය. එබඳු අවකාශයක අලුත් සහල් මංගල්‍යක් පවත්වන්නේ කෙසේද යන උභතෝකෝටිකයකට අපි මුහුණ දුන්නෙමු. මිහිමඬල නිවා සනහන පහන් ප්‍රාර්ථනාව තේමා ගතවූයේ ඒ අයුරිනි. දැවෙන මිහිමඩලේ කාලගුණික හා දේශගුණික වෙනස්කම් ගොවි ජනතාවටද, මහ පොළොවටද, දරාගත නොහැකි විය. ඒ නිසා මිනිස් වර්ගයා වෙත මිහිමඬල සුවපත් කරන දියුණුවේ ගමනකට ඇරයුම් කරනු පිණිස මෙවර අලුත් සහල් මංගල්‍යය අවස්ථාවක් කොට ගැනීමට අපි තීරණය කළෙමු. මෙම සියළු කටයුතු වලදී ගොවිජන සේවා හා වනජීවි අමාත්‍යතුමාගේ හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් පරිදි ගොවිජන සේවාවන්හි නවමු අපේක්ෂාවන් මල්ඵල ගැන්වීමටද අලුත් සහල් මංගල්‍ය හේතු විය.

හතර වාහල් කඩ කිරි ඉතිරිවීමේ සිට අලුත් සහල් පෙරහැර ශ්‍රී මහ බෝධීන් වහන්සේ අභියසට පැමිණ පූජා කිරීම දක්වා කටයුතු සජීවීව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මගින් හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් ප්‍රචාරය කිරීම පෙර වර්ෂවලදී මෙන් මෙවරද සිදුවිය. රූපවාහිනී ප්‍රචාරය සඳහා ලංකා බැංකුව වියදම දරන ලදි.

මෙවර අලුත් සහල් මංගල්‍යයේදීද මී පැණි පූජාව හා ගිතෙල් පූජාවද සිදු කරන ලදී. ආදිවාසී නායක ඌරුවරිගේ වන්නියලා ඇත්තෝ ප්‍රමුඛ ආදිවාසී කණ්ඩායම මී පැණි පූජාව පවත්වන ලද අතර රත්නපුර මහ සමන් දේවාලයේ බස්නායක නිලමේ විසින් ගිතෙල් සැපයීම කරන ලදී.

ගොවිජන සේවා හා වනජීවි අමාත්‍ය ගරු එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා ඇතුළු මැති ඇමතිවරුන්ද රාජ්‍ය නිලධාරීන්ද මෙම උත්සවයට සහභාගී වූහ.

දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් එක්රැස් කර භාරදුන් සහල් මෙදින පූජාකරණ ලදී. සහල් හා මුදල් ආධාර සැපයීම දිවයින පුරා පිහිටි ගොවි සංවිධාන විසින් කරන ලදී.

මෙම අලුත් සහල් මංගල්‍යය සාර්ථක කරගැනීමට ගොවිජන සේවා හා වනජීවි අමාත්‍යාංශය යටතේ ඇති සියළු රාජ්‍ය ආයතනයන්ද විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, අධිකාරි, මණ්ඩල, උතුරු මැද පළාත් සභාව හා පෞද්ගලික ආයතනත් විශාල දායකත්වයක් ලබා දෙන ලදී. මෙහිදී මිහිමඬල නිවා සනහන පහන් ප්‍රාර්ථනාව නමින් සමරු කලාපයක්ද එළි දක්වන ලදී.

## 2.13 යාන්ත්‍රික අංශය

### දෙපාර්තමේන්තුව සතු ඩෝසර් / එක්ස්කැවේටර් යන්ත්‍ර

සංවර්ධන හා ප්‍රගති පාලන අංශය සම්බන්ධව කටයුතු කරන යාන්ත්‍රික අංශය සහකාර කොමසාරිස් වරයෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

දැනට අප දෙපාර්තමේන්තුව සතු යන්ත්‍ර ප්‍රමාණය 58 කි. එයින් යන්ත්‍ර 20 ක් පහත දැක්වෙන වර්ෂ වලදී "ජපන් යෙන්" ප්‍රදානය යටතේ ලැබී ඇත. තවද, 2009 , 2011 වර්ෂවලදී භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් මිනි එක්ස්කැවේටර් /පොන්ටූන් යන්ත්‍ර දෙකක් ද ලබාගෙන ඇත.

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය - | **1983** | **1984** | **1985** | **1986** | **1990** | **1994** | **1997** | **1999** | **2009** | **2011** | එකතුව |
| යන්ත්‍ර සංඛ්‍යාව - | **01** | **01** | **06** | **02** | **02** | **05** | **01** | **02** | **01** | **01** | **= 22** |

දැනට එක් ඩෝසර් යන්ත්‍රයක් ද, ට්‍රැක් ෂවල් යන්ත්‍රයක්ද අබලන් තත්වය මත සේවයෙන් ඉවත් කර අපහරණය කිරීමට කටයුතු කර ඇති අතර දැනට ඉතිරිව ඇති යන්ත්‍ර ප්‍රමාණය 20 කි.

මීට අමතරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් චීන යන්ත්‍රෝපකරණ 36 ක් ද 2011 වර්ෂය අවසානයේදී ලැබී ඇත.එම යන්ත්‍ර 2012 වර්ෂයේදී සේවයට එක් කරනු ලැබ ඇත.

**2012 දී දෙපාර්තමේන්තු යන්ත්‍ර ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක**

| **දිස්ත්‍රික්කය** | **යන්ත්‍ර ප්‍රමාණය** |
|---|---|
| 01. හම්බන්තොට | 12 |
| 02. මොණරාගල | 06 |
| 03. කුරුණෑගල | 13 |
| 04. අනුරාධපුරය | 23 |
| 05. කොළඹ | 04 |
| **එකතුව** | **58** |

2009,2011 වර්ෂවලදී මිලට ගෙන ඇති පොන්ටූන් යන්ත්‍ර හැර අනිකුත් යන්ත්‍ර සියල්ලක්ම පාහේ දැනටමත් සේවා පැය 10,000 සීමාව පසු කර ඇති අතර, භාවිතා කල වර්ෂ ගණනාව අනුවද **යන්ත්‍ර වල සම්පූර්ණ ආයු කාලය** ඉකුත්වී ඇති බව ඉහත අනුව පැහැදිලි වනු ඇත.

එනමුත් ඉතා දැඩි කැපවීමකින් යුතුව, මනා පරිශ්‍රමයකින් හා පාලනයකින් යුතුව නඩත්තු කර ඇති බැවින් මේවායින් **වැඩි ප්‍රමාණයක් තවමත් හොඳම යාන්ත්‍රික තත්වයෙන්** යුතුව තවදුරටත් නඩත්තු කරගෙන යාමට හැකිවී ඇත. යන්ත්‍ර නඩත්තුව සඳහා 2012 වර්ෂයට වෙන් කර තිබූ ප්‍රතිපාදනය **රු.මිලි 14** කි. වියදම රු.මි. 8.92 කි. **(මෙවැනි යන්ත්‍රයක නව වටිනාකම රු.මිලියන 12-15 අතර ප්‍රමාණයක් වේ.)**

එම යන්ත්‍ර සහනදායී මිලකට ගොවි ජනතාව වෙත ලබා දීමට කටයුතු කරන අතර එම මිල යන්ත්‍ර සේවා පැයකට රු.500/= සිට රු.750/= ක් පමණ වේ.(සාමාන්‍යයෙන් මෙවැනි යන්ත්‍රයක් සේවා පැයකට අය කරනු ලබන වෙළඳ පොල වටිනානම රු.3000/= සිට රු.4000/= දක්වා වේ.). එලෙස ගොවි ජනතාව වෙත සේවා සිදු නොකරන විටදී වෙනත් රජයේ කෘෂි / වාරි මාර්ග / සංවර්ධන වැඩසටහන් වලටද යොදවනු ලබන අතර එවිටද රජයේ ගාස්තුවක් ලෙස අය කරනු ලබන්නේ රු.750/= ක (උපරිම) ගාස්තුවක් වේ.

ඉතා දුර බැහැර අති දුෂ්කර තත්වයන් යටතේ සේවා අවශ්‍යතාවය මත ගොවි ජනතාව වෙත උපරිම අයුරකින් සේවයේ යොදවනු ලබන මෙම යන්ත්‍ර මඟින් 2012 වර්ෂයේ දී රජයට ලබා දී ඇති සහනදායී පදනම යටතේ උපයා ගත් ආදායම රු.5107180.00 කි. නොයෙක් මූල්‍ය හේතූන් හා ප්‍රතිපාදන ලැබී තිබුණ ද මුදල් ලැබීමට සිදුවූ ප්‍රමාදයන් නිසා අදාළ දිස්ත්‍රික්ක වලින් තව දුරටත් ආදායම් ලැබීමටත් ඇති බව පෙනී යයි.

2012 ජූනි මස අග සිට අගෝස්තු මස අවසානය දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ වගා ළිං සකස් කිරීම හා වැව් වල රොන් මඩ ඉවත් කිරීම ඇතුළු කර්මාන්ත සඳහා සේවා පැය 4000 කට අධික ප්‍රමාණයක් වැය කර ඇත. ඒ අනුව යන්ත්‍රයක එක් මීටර් පැයකින් ඉටු කරනු ලබන කර්මාන්තයක ප්‍රාදේශීය වෙළඳ වටිනාකම රු.4000/= ක් ලෙස මධ්‍යස්ථ අගයක් ගෙන ගණනය කලහොත් අප යන්ත්‍ර වෙතින් අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා ඉටු කරන ලද කර්මාන්ත වල වෙළඳ වටිනාකම රු.මි.16.0 ක් පමණ වනු ඇත. (විවිධ යන්ත්‍ර වල එක් මීටර් පැයක වෙළඳ වටිනාකම විවිධ වන අතර උදාහරණයක් වශයෙන් එක්ස්කැවේටර් යන්ත්‍රයක සේවා මීටර් පැයක වෙළඳ වටිනාකම රු.6000.00 ක් පමණ වන බවද සලකන්න).

<u>2012 වර්ෂයේ යන්ත්‍ර අලුත් වැඩියාවන් සඳහා සිදු කර ඇති වියදම්</u>

| | | |
|---|---|---|
| 01. | DAS 26 ඩෝසර් යන්ත්‍රය - | රු. 195,261.92 |
| 02. | DAS 29 ඩෝසර් යන්ත්‍රය - | රු. 283,402.11 |
| 03. | DAS 30 ඩෝසර් යන්ත්‍රය - | රු. 540,257.52 |
| 04. | DAS 45 ඩෝසර් යන්ත්‍රය - | රු. 1,541,835.12 |
| 05. | DAS 46 ඩෝසර් යන්ත්‍රය - | රු. 593,371.52 |
| 06. | DAS 48 ඩෝසර් යන්ත්‍රය - | රු. 384,216.00 |
| 07. | DAS 49 ඩෝසර් යන්ත්‍රය - | රු. 562,083.20 |
| 08. | DAS 51 ඩෝසර් යන්ත්‍රය - | රු. 505,550.08 |
| 09. | DAS 52 ඩෝසර් යන්ත්‍රය - | රු. 745,409.28 |
| 10. | DAS 53 ඩෝසර් යන්ත්‍රය - | රු. 1,697,567.20 |
| 11. | DAS 54 ඩෝසර් යන්ත්‍රය - | රු. 301,073.80 |
| 12. | DAS 55 ඩෝසර් යන්ත්‍රය - | රු. 63,217.28 |
| 13. | DAS 95 ඩෝසර් යන්ත්‍රය - | රු. 1,150.00 |

# 3. ප්‍රධාන ඉංජිනේරු අංශය

## 3.1 කාර්යය

1. දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන සුළු වාරිමාර්ග, ගොවිජන සේවා මධ්‍යස්ථාන, ගොඩනැගිලි, දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම් හා අළුත් වැඩියාවන් පිළිබද ඇස්තමේන්තු අනුඥාත කිරීම, ටෙන්ඩර් මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා තාක්ෂණ වාර්තා සකස් කිරීම සහ ටෙන්ඩර් ඇගයීම් කටයුතු සිදුකිරීම.
2. මහවැලි අධිකාරිය යටතේ උණ වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
3. බාහිර රාජ්‍ය ආයතනවලින් ඉදිරිපත් කරන පාරිසරික තාක්ෂණ ඇගයීම් පිළිබද ක්ෂේත්‍ර පරීක්ෂණය හා අදාල වාර්තා සැපයීම.
4. USAid ආධාර යටතේ 2012 වර්ෂය සඳහා පොහොර ගබඩා 03ක් ඉදිකරන ලදී.

| දිස්ත්‍රික්කය | පොහොර ගබඩාවේ නම | වියදම් කළ මුදල රු. |
|---|---|---|
| 1) යාපනය | කරෛනගර් | 3,040,764.04 |
| 2) මුලතිව් | ඕලුමඩු | 3,232,298.29 |
| 3) කිලිනොච්චි | කිලිනොච්චි | 3,090,338.66 |

# 4. ආයතනික සංවර්ධන අංශය

## අරමුණ හා වගකීම

ගොවිජනතාවගේ කෘෂිකාර්මික අවශ්‍යතා සපුරාදීම මඟින් ඔවුන්ගේ ආර්ථිකමය හා සමාජයීය පසුබිම ශක්තිමත් කිරීම අරමුණුකොට මැදිහත්කරුවෙක් ගේ භූමිකාව ඉටු කිරීම පිණිස සමස්ත ගොවිජන සේවා මධ්‍යස්ථාන ජාලය මෙහෙයවීම සඳහා මෙම අංශය තුළ පැවති දැඩි මානව සම්පත් ඌනතාවය මධ්‍යයේ 2012 වර්ෂය තුළ ඉටුකරන ලද කාර්යභාරය ඒ ඒ විෂයයන් ඔස්සේ පහත සඳහන් පරිදි පෙළගස්වනු ලැබේ.

## 4.1 ගොවිජන සේවා මධ්‍යස්ථාන අධීක්ෂණය.

2012 අවසන් කාර්තුවේදී සහකාර කොමසාරිස් (සේවා) සහ උපාධිධාරි අභ්‍යාසලාභීන් අංශයට අනුයුක්තවීම සමඟ මානව සම්පත් හිඟය තරමක් දුරට විසඳීම තුළ ගොවිජන සේවා මධ්‍යස්ථාන අධීක්ෂණ කටයුතු විධිමත් කරගැනීමට හැකිවිය.

i. 2012 වර්ෂයේ I, II, III හා IV කාර්තු තුළ ලැබී ඇති මධ්‍යස්ථාන පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව 308කි.

ii. අවසන් ගිණුම් වාර්තා :

අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත්ව ඇති ගැටළුවක් වශයෙන් 2012 වර්ෂය තුළ අවස්ථා කිහිපයකදීම දිස්ත්‍රික්ක දැනුවත් කරනලද අතර, පසුගිය වර්ෂවලට සාපේක්ෂව බලන විට මෙම වර්ෂය තුළ අවසන් ගිණුම් වාර්තා ලැබීම සැළකිය යුතු ප්‍රගතියක් පෙන්වයි.

පහත සඳහන් පරිදි අවසන් ගිණුම් වාර්තා 625ක් 2012 වර්ෂය තුළ ලැබී ඇත.

| | | | | |
|---|---|---|---|---|
| 2012 වර්ෂය තුළ | 2012 | - | අවසන් ගිණුම් | 03 |
| | 2011 | - | අවසන් ගිණුම් | 322 |
| | 2010 | - | අවසන් ගිණුම් | 120 |
| | 2010 ට පෙර වර්ෂයේ ගිණුම් | | | 180 |

### 4.1.1 නව ගොවිජන සේවා මධ්‍යස්ථාන පිහිටුවීම.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සාලියපුර සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මයුරපුර නව ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකක් මෙම වර්ෂයේදී ස්ථාපනය කරන ලද අතර, මයුරපුර ගොවිජන සේවා මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය උපකරණ හා ලිපි ද්‍රව්‍ය සපයා ගැනීම පිණිස ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු අනුව ගොවිජන සංවර්ධන අරමුදලෙන් රු: 428,125/- මුදල් ප්‍රතිපාදන ලබාදී ඇත.

## 4.2 කමිටු සේවක ගැටළු.

රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා ගොවිජන සේවා හා වනජීවි අමාත්‍යාංශයේ නිර්ණායක මත තෝරාගන්නා ලද කමිටු සේවක 96 දෙනා සම්බන්ධයෙන් නැවත ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශයක් අනුව, එම පිරිස ගොවිජන සේවා මධ්‍යස්ථාන කමිටු ලිපිකරු තනතුරුවල පුරප්පාඩු සඳහා අනුයුක්ත කිරීමට ලැබී ඇති අනුමැතිය පරිදි ඉදිරි පියවර සඳහා අවශ්‍ය තොරතුරු ආයතන අංශය වෙත යොමු කරනලදී.

* කම්ටුවල ආදායම් වර්ධනය කිරීම හා එමඟින් සේවක දීමනා වැඩි කිරීම.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයේ උපදෙස් පරිදි, කම්ටු ආදායම් වර්ධනය කර ගැනීම සඳහා දිස්ත්‍රික්කවලින්ද යෝජනා කැඳවා කම්ටුවක් විසින් සකසන ලද, යෝජනා ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කරනලදී. ඒ අනුව දිස්ත්‍රික්ක වෙත නිකුත්කිරීම සඳහා උපදෙස් චක්‍රලේඛයක් කෙටුම්පත් කෙරේ.

## 4.3 අක්කර බදු අයකිරීම.

* 2012 වර්ෂය තුළ අක්කර බදු 20% දායක වශයෙන් ලැබී ඇති රු: 8,541,628.36ක මුදලක් ගොවිජන සංවර්ධන අරමුදලට බැර කර ඇත.
* ඉදිරි වර්ෂ දෙක තුළ නිවැරදිව හා නිරවුල්ව ඉලක්ක ගත දායක මුදල් ගෙන්වා ගැනීම සඳහා මේ වන විට සුදුසු ආකෘතීන් සමඟ අවශ්‍ය දැනුවත් කිරීම් සිදුකර ඇත. ඉදිරි වර්ෂය සඳහා අක්කර බදු සතියක් පැවැත්වීම පිළිබඳව ද උපදෙස් ලබාදී ඇත.

## 4.4 පොදු මුදල් / අක්කර බදු / කුවිතාන්සි පොත් සහ මුදල් පොත් සැපයීම.

* පොදු මුදල් සහ අක්කර බදු කුවිතාන්සි පොත් සඳහා වන පළමුවන ඇණවුම (2008) මෙම වර්ෂයේදී අවසන්වීමට නියමිතව තිබුණ බැවින් පොදු මුදල් කුවිතාන්සි පොත් ලක්ෂ 02 ක් සහ අක්කර බදු කුවිතාන්සි ලක්ෂ 01 සඳහා රජයේ මුද්‍රණාලය මේ ඇණවුම් කරන්නට යෙදුණි.
* 2012 වර්ෂය තුළ පහත සඳහන් පරිදි කුවිතාන්සි පොත් අලෙවියෙන් ලැබී ඇති රු. 2,157,500.00ක මුදලක් ගොවිජන සංවර්ධන අරමුදලට බැර කර ඇත.

| කුවිතාන්සි පොත් වර්ගය | ප්‍රමාණය | මුදල (රු.) |
|---|---|---|
| පොදු මුදල් කුවිතාන්සි පොත් | 26,805 | 1,340,250 |
| අක්කර බදු මුදල් කුවිතාන්සි පොත් | 12,835 | 641,750 |
| කම්ටු මුදල් පොත් | 135 | 175,500 |
| එකතුව | 39,775 | 2,157,500 |

## 4.5 කම්ටු සාමාජික දීමනා.

* මේ සඳහා 2012 වර්ෂයට රු. මිලියන 2.5ක මුදල් ප්‍රතිපාදන විසර්ජන පනතින් වෙන්කර ඇති අතර, දිස්ත්‍රික්ක 25 සඳහා ඒ ඒ කාර්තුවලට අදාළව රු. 2,157,900.00ක මුදලක් වෙන්කර දී ඇත.
* එක් කම්ටු රැස්වීම් වාරයක් සඳහා එක් සාමාජිකයෙකුට ජාතික අයවැය ප්‍රතිපාදන යටතේ දැනට ගෙවනු ලබන රු.50/= දීමනාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, මෙම රැස්වීම් සඳහා කම්ටු සාමාජිකයින්ගේ ඇති අඩු සහභාගීත්වය සැළකිල්ලට ලක් කරමින්, කම්ටු තීරණ මත රු.350/=ක් දක්වා දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබාදෙන ලදී.

## 4.6 ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා සේවා සැපයීම .

**පහත වගුවේ දැක්වෙන පරිදි ගොවි ජනතාවට අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය, පැළ වර්ග, කෘෂි උපකරණ හා වෙනත් අවශ්‍ය කෘෂිකාර්මික ද්‍රව්‍ය 2012 වර්ෂය තුළ දී ද , ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා සපයා දී ආදායම් උපයා ඇත.**

| දිස්ත්‍රික්කය | බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවිය | | | කෘෂි උපකරණ අලෙවි වටිනාකම (රු.) | නිෂ්පාදන අලෙවි වටිනාකම (රු.) | වෙනත් අලෙවි ආදායම වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|
| | බිත්තර බීජ සැපයුම (කි.ග්‍රෑ.) | එළවළු හා වෙනත් බීජ වටිනාකම (රු.) | පැළ වර්ග වටිනාකම (රු.) | | | |
| කොළඹ | 4838.88 | 2096590.00 | 2777714.00 | 1612630.00 | 0 | 726330.00 |
| ගම්පහ | 17951.00 | 2658445.00 | 7891394.00 | 2272039.00 | 229539.00 | 4449635.20 |
| කළුතර | 7990.00 | 1833617.00 | 2571116.00 | 355323.50 | 42946.00 | 701215.00 |
| මහනුවර | 1106.65 | 1303711.00 | 181299.00 | 4736942.00 | 82515.00 | 407419.73 |
| මාතලේ | 4236.00 | 1212123.00 | 274460.00 | 3513029.92 | 47160.00 | 2958394.00 |
| නුවරඑළිය | 90557.00 | 1891643.00 | 1801386.00 | 11205433.00 | 138177.50 | 800457.00 |
| ගාල්ල | 6762.00 | 1028666.00 | 2016298.00 | 471127.00 | 422395.00 | 2186763.00 |
| මාතර | 3612.50 | 1286614.50 | 322812.00 | 832789.00 | 41019.00 | 80971.00 |
| හම්බන්තොට | 2108.00 | 197991.00 | 63457.00 | 235016.00 | 0 | 0 |
| කුරුණෑගල | 3631.00 | 445477.00 | 176110.00 | 1250359.00 | 85890.00 | 565866.00 |
| පුත්තලම | 5614.00 | 2383852.80 | 2363767.00 | 1752918.50 | 4880.00 | 67726.00 |
| අනුරාධපුරය | 308.00 | 354950.00 | 131505.00 | 157400.00 | 0 | 443459.00 |
| පොළොන්නරුව | 3494.00 | 519389.00 | 38180.00 | 1064281.50 | 1105.00 | 434877.50 |
| බදුල්ල | 2320.75 | 5421796.75 | 135443.00 | 12028958.14 | 195.00 | 1266097.50 |
| මොණරාගල | 247852.00 | 1243334.74 | 209057.00 | 1239457.29 | 22205.00 | 540318.00 |
| රත්නපුරය | 65864.96 | 791231.50 | 872142.00 | 789249.25 | 102858.25 | 732440.25 |
| කෑගල්ල | 1382.00 | 670237.00 | 2256345.00 | 2289194 | 290764.00 | 191309.00 |
| අම්පාර | 129.00 | 1048263.00 | 0 | 0 | 0 | 0 |
| ත්‍රිකුණාමලය | 33.00 | 340.00 | 18045.00 | 0 | 0 | 31905.00 |
| යාපනය | 22500.00 | 102927.50 | 20450.00 | 17650.00 | 0 | 0 |
| එකතුව | **492290.74** | **26491199.79** | **24120980** | **45823797.10** | **1511648.75** | **16585183.18** |

## 4.7 කෙතට අරුණ පොහොර සහනාධාර වැඩසටහන

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන සහනාධාර පොහොර වැඩ සටහන **ක්‍රියාත්මක කිරීමේදී මෙම වර්ෂය තුළ 2011/2012 මහ කන්නය, 2012 යල කන්නය හා 2012/2013 මහ කන්නය යන කන්න තුනම අන්තර්ගත වේ. ඒ අනුව මෙම කන්න තුන තුළම පොහොර නිකුත් කිරීම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| කන්නය | පොහොර ලබාගත් ගොවීන් සංඛ්‍යාව | කුඹුරු අක්කර ප්‍රමාණය | නිකුත් කරණ ලද පොහොර ප්‍රමාණය | | | |
|---|---|---|---|---|---|---|
| | | | යූරියා (MT) | T.S.P(MT) | M.O.P(MT) | එකතුව(MT) |
| **2011/2012** මහ | **1,049,546** | **2,201,052.81** | **163,143.64** | **52,614.41** | **47,958.66** | **263,716.91** |
| **2012** යල | **652,281** | **881,210.14** | **89,924.56** | **32,468.22** | **29,292.88** | **151,685.66** |
| **2012/2013** මහ* | **921,901** | **1,554,227.91** | **140,899.90** | **47,273.60** | **42,472.84** | **230,646.33** |

*2012/2013 මහ කන්නයට අදාළව මේවනවිට ලැබී ඇති වාර්තා අනුව තොරතුරු සකස් කර ඇත. අවසන් වාර්තා තවදුරටත් ලැබෙමින් පවතී.

### 4.7.1 ජාතික පොහොර සතිය

2012 යල කන්නයේ 2012.05.25 සිට 2012.05.31 දක්වාද, 2012/13 මහ කන්නයේ 2012.10.20 සිට 2012.12.27 දක්වාද ජාතික පොහොර සතිය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ සියළුම ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලවල සහ ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හි, පොහොර සහනාධාර වැඩසටහනෙහි වැදගත්කම හා ඒ වෙනුවෙන් රජයේ දායකත්වය පිළිබඳ ගොවීන් සහ වෙනත් අදාළ පාර්ශව දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීමට කටයුතු කරන ලදී. එහිදී අදාළ බැනර් සහ පොහොර ප්‍රතිඥා පත්‍රිකා 60,000 ක්ද දිස්ත්‍රික්ක වෙත බෙදාහැරීමට කටයුතු කරන ලදී.

## 4.8 කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරි ගැන්වීම.

* කෘෂිකර්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන සඳහා 2012 වර්ෂය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කරදීමක් සිදු නොවූ බැවින්, මෙම වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක නොකෙරිණි.

* එහෙත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පොහොර ලේකම් කාර්යාලය වෙත 2012 වර්ෂයේ කාබනික පොහොර ව්‍යාපෘති වෙනුවෙන් වෙන් කර දී ඇති ප්‍රතිපාදන යටතේ අනුරාධපුරය සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙකෙහි නියමු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, අදාළ වැඩසටහන්වල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| දිස්ත්‍රික්කය | කාබනික පොහොර ඒකක සංඛ්‍යාව | කාබනික පොහොර නිපදවන ගොවීන් සංඛ්‍යාව | බෙදා දී ඇති කෘෂි උපකරණ ප්‍රමාණයන් | | | | නිෂ්පාදිත කාබනික පොහොර ප්‍රමාණය | කාබනික පොහොර නිකුත් කිරීමට හඳුනාගෙන ඇති වී ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | උපකරණ කට්ටල සංඛ්‍යාව | තණ කොළ කපන මැෂින් | පොලිතීන් ප්‍රමාණය | හට් ප්‍රමාණය | | |
| අනුරාධපුරය | 671 | 2843 | 20820 | 597 | 17504.96 | 200 | 2553332 | 19845 |
| පොළොන්නරුව | 198 | 2470 | 2470 | 198 | 2475.200 | - | 1882398 | 13052 |

## 4.9 2 KR - ජපන් යෙන් ආධාර යටතේ ට්‍රැක්ටර් බෙදාහැරීම හා කළමනාකරණය

2KR 2010 ජපන් ආධාර ව්‍යාපෘතිය යටතේ, කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා 2012 වර්ෂයේදී පහත සඳහන් පරිදි රෝද 02 ට්‍රැක්ටර් 820ක් හා රෝද 04 ට්‍රැක්ටර් 32ක් දෙපාර්තමේන්තුව වෙත ලැබුණි.

| | | |
|---|---|---|
| රෝද 02 ට්‍රැක්ටර් (රොටවේටරය හා අමතර කොටස් කට්ටලය සහිතව) | මිට්සුබිෂි වර්ගය - 701<br>කුබෝටා වර්ගය - 119 | 820 |
| රෝද 04 ට්‍රැක්ටර් (රොටවේටරය සමඟ) | සාමේ 503 වර්ගය | 32 |

මෙසේ ලද රෝද 02 ට්‍රැක්ටර්, නියමිත ක්‍රමවේදයක් යටතේ තෝරාගත් ගොවීන් වෙත රු.250,000.00ක් වන සහන මිලට හා රෝද 04 ට්‍රැක්ටර් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත රු.650,000.00ක් වන සහන මිලට, අදාළ වටිනාකම් වසර 03ක් තුළ වාරික වශයෙන් අයකරගැනීමේ පදනම මත නිකුත් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ ලද මුළු රෝද 02 ට්‍රැක්ටර් 820න් 505ක් හා රෝද 04 ට්‍රැක්ටර් 32න් 12ක් උතුරු නැගෙනහිර පළාත් වලට අයත් දිස්ත්‍රික්ක වෙත බෙදාහරින ලද අතර, එය සමස්ථ ව්‍යාපෘතියෙන් 61% ප්‍රතිශතයකි.

එසේම පෙර වර්ෂවලදී දෙපාර්තමේන්තුව මගින් බෙදාහරින ලද ට්‍රැක්ටර්/කෘෂි උපාංග වෙනුවෙන් හා 2012 වර්ෂයේදී බෙදාහරින ලද ට්‍රැක්ටර් වෙනුවෙන් 2012 වර්ෂය තුළ අයකර ඇති වාරික මුදල් ප්‍රමාණයන් පහත පරිදි වේ.

### 4.9.1 රෝද 02 ට්‍රැක්ටර් වාරික මුදල්

| | |
|---|---|
| 1992-2001 වර්ෂ තුළ ගොවි සංවිධාන වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | -රු. 350,970.00 |
| 2006 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | -රු. 815,521.00 |
| 2008 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | -රු. 8,347,779.00 |
| 2010 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | -රු. 36,442,049.00 |
| 2012 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | -රු. 10,687,562.00 |
| එකතුව | -රු. 56,643,881.00 |

=============

### 4.9.2 රෝද 04 ට්‍රැක්ටර් වාරික මුදල්

1989-2001 දක්වා ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබාදී ඇති ට්‍රැක්ටර් සඳහා -රු. 544,642.16

### 4.9.3 වතුර පොම්ප වාරික මුදල්

2010 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කරන ලද වතුර පොම්ප සඳහා -රු. 1,971,443.00

2012 වර්ෂයේදී රෝද 02 හා රෝද 04 ට්‍රැක්ටර් අමතර කොටස් අලෙවියෙන් රු.143,133.50ක මුදලක් අයවී ඇත.

## 4.10 දිවි නැගුම වැඩසටහන.

දිවි නැගුම ජාතික වැඩසටහනේ III හා IV අදියර 2012 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ ගෘහ ආර්ථික ඒකක ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ගෙවතු සංවර්ධන වැඩසටහනට අදාළව III අදියර යටතේ බීජ කට්ටල 2,500,000ක් ද, IV අදියර යටතේ බීජ කට්ටල 5,000,000ක් ද දිවයින පුරා සියලුම පවුල් ඒකකයන් ආවරණය වන පරිදි බෙදාහැරීමේ කටයුතු සිදුකරන ලදී.

මේ සඳහා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක කාර්යාල හා ක්ෂේත්‍ර මට්ටමේ සියලු නිලධාරීන්ගේ පූර්ණ දායකත්වය හා කැපවීම මත මෙම කටයුතු සාර්ථකව ඉටුකර ඇත.

### 4.10.1 දිවිනැගුම අවුරුදු පොළවල් පැවැත්වීම

අලුත් අවුරුදු සමයේ ජනතාව වෙත අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සහන මිලට හා පහසුවෙන් ලබාගැනීමට හැකිවන සේ, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ, දිවයින පුරා ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හි මැදිහත්වීමෙන් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සම්බන්ධ වී දිවිනැගුම අවුරුදු පොළවල් 82ක් 2012 වර්ෂය තුළ පවත්වන ලදී.

## 4.11 විශේෂ වැඩසටහන්.

2012 යල කන්නයේ නියඟයෙන් විපතට පත් ගොවීන්ට නොමිලේ බිත්තර වී බෙදාදීමේ වැඩසටහනක් කුරුණෑගල, අනුරාධපුර, පොළොන්නරුව හා පුත්තලම යන දිස්ත්‍රික්ක වල ක්‍රියාත්මක විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගබඩා සහ ඇග්ස්ටාර්, හේලීස් ඇග්‍රෝ ෆාම්ස් යන පුද්ගලික සමාගම් මගින් සපයාගන්නා ලද බිත්තර වී දිස්ත්‍රික්ක වල ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හි දායකත්වයෙන් ගොවීන් වෙත බෙදාහැරීම් කටයුතු සිදුකරන ලදී. මෙහිදී එම දිස්ත්‍රික්ක වෙත බෙදාදුන් බිත්තර වී ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

| දිස්ත්‍රික්කය | බෙදාදුන් බිත්තර වී ප්‍රමාණය(බුසල්) |
|---|---|
| කුරුණෑගල | 115,645 |
| අනුරාධපුර | 84,805 |
| පොළොන්නරුව | 75,914 |
| පුත්තලම | 11,265 |
| එකතුව | 287,625 |

2012 වර්ෂය ආරම්භයේදී එතෙක් මෙම අංශයෙන් ක්‍රියත්මක කරන ලද පුරන්කුඹුරු නැවත අස්වැද්දීම හා එම විෂයයට බැඳන වප් මඟුල්, ගොවි සතිය යන අනු විෂයයන් ද, දැයට කිරුළ ප්‍රදර්ශනයට අදාළ කටයුතු ද සංවර්ධන අංශය වෙත පවරා ගන්නා ලදි.

# 5.ප්‍රවාහන අංශය

2012 වර්ෂයේ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සියළුම සංවර්ධන වැඩ, පනතේ නීතිමය කාර්යයන් සහ පරිපාලනය මගින් පැවරෙන විවිධ නිල ප්‍රවාහන කටයුතු සඳහා ප්‍රවාහන අංශයේ විශාල දායකත්වයක් ලබා දෙන ලදී. මේ සඳහා සැහැල්ලු වාහන වන ජීප් රථ, ඩබල් කැබ් සහ මෝටර් රථ, සහ ලොරි, ටෙන් වීල්, ප්‍රයිම්මුවර් රථ හා ක්‍රේන්ට්‍රක් රථ ඇතුලත්ව වාහන 116 පමණ වන දෙපාර්තමේන්තුව සතු වාහන ඇණියක් යොදවා ගන්නා ලද අතර එම වාහන අතර ඉතා පැරණි වාහන ඇති බැවින් නිරන්තරයෙන් පැන නැඟුණු අලුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු ඉටුකර ගනිමින් ඉහත කාර්යයන්ට කිසිදු බාධාවකින් තොරව අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා දී ඇත.

මීට අමතරව ප්‍රධාන කාර්යාලය ඇතුළු සියළු දිස්ත්‍රික් කාර්යාල වල ඇති වාහන වල සියලුම නඩත්තු, අලුත්වැඩියාවන්, ඉන්ධන සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම, ආදායම් බලපත්‍ර ලබා ගැනීම්, අනතුරු පිළිබඳ නීතිමය කටයුතු, ධාවන සටහන් පරීක්ෂා කර විගණනය වෙත ඉදිරිපත් කිරීම, විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම, වාහන රක්ෂණය, වාර්ෂික ඇස්තමේන්තු සැකසීම, ප්‍රවාහන කටයුතු සම්බන්ධ දත්ත රැස් කිරීම හා ඉහළ පරිපාලනයට වාර්තා කිරීම, ඉන්ධන ඇණවුම් ලබා දීම සහ බිල්පත් පියවීම, මෙම අංශය මගින් ඉටුකරන කාර්යයන් වේ.

**2012 වර්ෂය සඳහා ප්‍රවාහන අංශය මගින් ඉටු කර ඇති කාර්යයන් සැකෙවින් පහත පරිදි වේ.**

1. නිලධාරි ප්‍රවාහන කටයුතු - කොළඹ දිස්ත්‍රික්කය ඇතුලත සහ දිවයින පුරා
2. දිවි නැඟුම රාජකාරි - බීජ සහ පොහොර ප්‍රවාහනය - දිවයින පුරා
3. වැව් ප්‍රතිසංස්කරණය සඳහා අධික බරෙන් යුතු සහ විශාල බුල්ඩෝසර් සහ එස්කැවේටර් යන්ත්‍ර දිවයින පුරා ප්‍රවාහනය.
4. කාබනික පොහොර නිෂ්පාදන ඒකක වෙත කෘෂි උපකරණ කට්ටල ප්‍රවාහනය කිරීම.
5. කාබනික පොහොර ප්‍රවාහනය, කෘෂිභෝග පුරෝකතන වැඩසටහන, අලුත් සහල් මංගල්‍යය, දැයට කිරුළ, වප් මඟුල්, ගොවි බැංකු වැඩසටහන් සඳහා ලොරි රථ, ජීප්, සහ කැබ් රථ යෙදවීම.
6. ගොවිජන සේවා සහ වන ජීවී අමාත්‍යාංශය මගින් පැවරූ ප්‍රවාහන රාජකාරි.
7. චීන රජයෙන් ආනයනය කරන ලද ඩෝසර් යන්ත්‍ර අලුතින් ස්ථාපිත කරන ලද අංගන වෙත ප්‍රවාහනයට.
8. යෙන් ආධාර යටතේ ලැබුණු ට්‍රැක්ටර් රථ හා කෘෂි උපකරණ දිවයින පුරා ප්‍රවාහනය.
9. ගර්හිත වාහන 06ක් ටෙන්ඩර් මගින් විකුණා අලුතින් වාහන 14 ක් අත්පත් කර ගැනීම.

# 6.නීති අංශය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් වලින් ප්‍රශස්ත ඵලදායිතාවක් ලබා ගනිමින් ශ්‍රී ලාංකීය ගොවි ජනතාව තිරසාර සංවර්ධනයක් සඳහා රැගෙන යාමේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දර්ශනය මුදුන්පත් කරලීම සඳහා පහත සඳහන් ආකාරයෙන් නීති අංශය එම මෙහෙවරට දායක වේ.

- ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සැකසීමට ගොවිජන නීතිය, ඊට අදාල රීති සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු අමාත්‍යාංශය වෙත ලබා දීම හා සහාය වීම.
- අඳ ගොවීන් හා ඉඩම් හිමියන් අතර ඇති වන කෘෂිකාර්මික ආරවුල් විසඳීම සඳහා වන නෛතික මගපෙන්වීම.
- වගා අයිතිවාසිකම් ආරක්ෂා කර දීම.
- ග්‍රාමීය වාරි කර්මාන්ත ආරක්ෂා කිරීම හා වගා රීති ක්‍රියාත්මක කිරීමට අදාල නීතිමය රැකවරණය සැලසීම.
- දෙපාර්තමේන්තු නිලධාරීන් හා ගොවීන් සඳහා නීතිමය උපදේශනය
- ගොවිජන නීතිය බලගැන්වීම සඳහා අධිකරණමය කාර්යයන්හි නිරත වීම.

## 4.7 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත.

2000 අංක 46 දරණ පනතට 2011 අංක 46 දරණ සංශෝධිත පනත ගෙන ආ අතර එය 2011.11.22 දින සිට ක්‍රියාත්මක වන බැවින් ඒ අනුව අඳ ගොවි අනුප්‍රාප්තිය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. එමගින් 2000.08.18 දින හෝ ඊට පෙර දිනවල ලිඛිත හෝ වාචික ගිවිසුමක් මත අඳ ගොවි අයිතිවාසිකම් හිමි අයකු මිය ගිය අවස්ථාවකදී අඳ අයිතිය උරුම විය යුතු බව සහ අඳ ගොවියා පූර්ණ දුබලතාවයකට පත් වූ විට අඳ ගොවි අනුප්‍රාප්තිය පැවරීම සඳහාද ප්‍රතිපාදන සලසා ඇත.

දැනට ක්‍රියාත්මක වන 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හා 2011 අංක 46 දරණ(සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නියෝග සාදා නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතියට යවා ඇති අතර කාලීනව ඉතාමත් වැදගත් වන කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂමව වගා කිරීම සඳහා වන පනතේ 22,23, 25 සහ 26 වගන්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නියෝග සාදා දැනටමත් වගා නොකර පුරන්ව පැවති කුඹුරු ඉඩම් විශාල ප්‍රමාණයක් වගා කෙරෙමින් පවතී.

## 4.8 ගොවි ආරවුල් විසඳීම. (ගොවිජන විනිශ්චය සභා)

ඉඩම් හිමියන් විසින් අඳ ගොවීන් නෙරපීම, අඳ ගොවීන් විසින් ඉඩම් හිමියන් වෙත ප්‍රවේනි ගෙවීම පැහැර හැරීම ඇතුලු ගොවිජන සංවර්ධන පනත යටතේ සඳහන් වගන්ති 10 ක් පමණ ගොවිජන විනිශ්චය සභාව මගින් පරීක්ෂණ පැවැත්විය යුතු ලෙස දක්වා ඇති අතර 2011 අංක 46 දරණ (සංශෝධිත) ගොවිජන සංවර්ධන පනතට අනුව ගොවිජන විනිශ්චය සභා වල තීරණයට එරෙහිව අභියාචනා කිරීම සඳහා පිහිටුවා ඇති සමාලෝචන මණ්ඩල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි කෙටුම්පත් කර නීති කෙටුම්පත් සම්පාදක වෙතින් නිර්දේශය ලැබ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත්කර ඇත.

ගොවිජන විනිශ්චය සහා පිහිටුවීම ප්‍රමාදවීම හේතුවෙන් ගොවිජන විනිශ්චය සභාව වෙත යොමුකිරීමට තබා ඇති ඉල්ලීම් සංඛ්‍යාව 2012 වර්ෂය දක්වා පහත සඳහන් ආකාරයෙන් වර්ධනය වී ඇත.

| වර්ෂය | ඉල්ලීම් සංඛ්‍යාව |
|---|---|
| 2004 | 660 |
| 2005 | 1151 |
| 2006 | 2327 |
| 2007 | 3422 |
| 2008 | 3510 |
| 2009 | 3945 |
| 2010 | 4285 |
| 2011 | 4583 |
| 2012 | 4915 |

## 6.3 ගොවි පැමිණිලි (පොදු)

ගොවිජන සංවර්ධන පනත යටතේ ලැබී ඇති පැමිණිලි.

| 2012 වර්ෂය තුළ ලැබීම් | 2012.01.01 දිනට ඉතිරි | 2012 වර්ෂය තුළ විසඳීම් | 2012.12.31 දිනට ඉතිරි |
|---|---|---|---|
| 9793 | 3650 | 7170 | 6173 |

## 6.4 අධිකරණ කටයුතු වලට මැදිහත්වීම්.

නීතිපති සහාය ලබා ගැනීමට කටයුතු කිරීම

| | | |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | - | 03 |
| අභියාචනාධිකරණය | - | 08 |
| මහාධිකරණය | - | 28 |
| දිසා අධිකරණය | - | 06 |
| මහේස්ත්‍රාත් අධිකරණය | - | 351 |

කුඹුරු ඉඩම් අනවසරයෙන් ගොඩ කිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමෙන් නීතිමය පියවර ගැනීම

2011 වර්ෂය තුළ ප්‍රගතිය පහත දැක් වේ.

1. අනවසර ගොඩ කිරීම් /ඉදි කිරීම් සඳහා තහනම් නියෝග ලබා ගත් සංඛ්‍යාව (33 වගන්තිය) - **216**
2. වරදට දඩුවම් කිරීම හා යථා තත්ත්වයට පත් කිරීම - (32 වගන්තිය) – **148**

## 6.5 කෘෂිකාර්මික ඉඩම් ලේඛන සම්බන්ධ කාර්යයන්:

ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක කිරීමේදී උක්ත පනතේ 53 වගන්තිය කෘෂිකාර්මික ඉඩම් ලේඛන සම්බන්ධයෙන් පනවා ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ එම කටයුතු අධීක්ෂණය කිරීම වැදගත් කාර්යයකි.දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ඇති කෘෂිකාර්මික ඉඩම් ලේඛන (ගොඩ/මඩ) මහජන පරීක්ෂාව සඳහා සෑම වර්ෂයකටම දෙවරක් එනම් ජනවාරි හා ජූලි මාස වල විවෘතව තබන බව පුවත්පත් මගින් දැනුම් දෙනු ලැබේ. එසේ විවෘතව තැබීමෙන් අනතුර ඒ පිළිබඳව ලැබෙන ඉල්ලුම්පත් පරීක්ෂා කර බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ගොවිජන සේවා කාරක සභාවල වගකීමකි. උක්ත ක්‍රියාවලියේ ප්‍රගතිය පහත ඉදිරිපත් කර ඇත.

### 6.5.1 කෘෂිකාර්මික ඉඩම් ලේඛන සංශෝධනය.

| 2012 වර්ෂය තුල ලැබීම් | පෙර වර්ෂ වල ඉතිරි | පරීක්ෂණ කළයුතු මුලු ගණන | පරීක්ෂා කර අවසන් | ඉතිරි සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 8805 | 23298 | 32103 | 5792 | 26211 |

## 6.6 නෛතික උපදේශන කාර්යයන්

දෙපාර්තමේන්තු නිලධාරීන් වගඋත්තරකරුවන් කරමින් අධිකරණයේ පවරනු ලබන නඩු සම්බන්ධයෙන් නීතිපති සහාය ලබා දීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී අධිකරණයේ පෙනී සිටීම සිදු කරනු ලැබේ. යම් යම් හේතූන් මත මානව හිමිකම් කොමිෂම මගින් සහනයක් අපේක්ෂා කරන්නන් සඳහා අවශ්‍ය සහාය ලබාදීම සහ පෙනී සිටීම සිදු කෙරේ.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත, මානව හිමිකම් කොමිෂම වෙත අවශ්‍ය අවස්ථාවන්හිදී පෙනී සිටිමින් කරුණු ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබේ. එහි විස්තර පහත දැක්වේ.

| | |
|---|---|
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් වූ පැමිණිලි (2012) | 08 |
| මානව හිමිකම් කොමිෂමට ඉදිරිපත් වූ පැමිණිලි (2012) | 07 |
| පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට පිළිතුරු සැපයීම (2012) | 04 |
| මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් වූ පැමිණිලි(2012) | - |
| අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාව (2012) | 01 |

# 7.ගිණුම් අංශය

2012 මහා භාණ්ඩාගාර මුද්‍රිත ඇස්තමේන්තු මගින් මෙම දෙපාර්තමේන්තුව වෙත රු. මිලියන 4089.18 ක ප්‍රතිපාදන වෙන් කර දී ඇත. එය මෙම දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වැඩසටහන් දෙකක විෂයෙහි පහත සදහන් පරිදි බෙදී ඇත.

<u>පුනරාවර්තන වියදම්</u>

| | | |
|---|---|---|
| 281- වැඩසටහන - 1 | රු. මි. 211.08 | |
| වැඩසටහන -2 | රු.මි. 3049.00 | රු.මි. 3260.08 |
| මූලධන වියදම් | | |
| 281-වැඩසටහන - 1 | රු.මි. 43.50 | |
| වැඩසටහන - 2 | රු.මි. 785.60 | රු.මි. 829.10 |
| | | රු.මි. 4089.18 |

**මූලධන ප්‍රතිපාදන සංවර්ධන කාර්යයන් වල යෙදවී ඇති අයුරු.**

| **ක්ෂේත්‍රය** | **අනුමත වැය ශීර්ෂ (රු.මි.)** | **වියදම (රු.මි.)** |
|---|---|---|
| දිස්ත්‍රික් කාර්යාල හා ගොවිජන සේවා මධ්‍යස්ථාන | 122 | 94.39 |
| අළුත්වැඩියාව | 40 | 21.1 |
| දිස්ත්‍රික් කාර්යාල හා ගොවිජන සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම් | 75.5 | 46.9 |
| යන්ත්‍රෝපකරණ/වාහන අළුත්වැඩියාව/මිලදී ගැනීම් (ඩෝසර්,ට්‍රැක්ටර්,වෙනත්) | 41 | 39.9 |
| කාර්යාල උපකරණ හා වෙනත් | 250 | 195.16 |
| විශේෂ ව්‍යාපෘතිය | 280 | 157.82 |
| පුරන් කුඹුරු අස්වැද්දීම | 2.6 | 2.59 |
| පොහොර ගබඩා ඉදි කිරීම | 3.0 | 2.98 |
| පුහුණු හා හැකියා වර්ධන | 15.0 | 1.32 |
| දැයට කිරුළ | | |
| එකතුව | 829.10 | 562.16 |

**2012 වර්ෂයේ ප්‍රගතිය**

| **විස්තරය** | **2012.12.31 දිනට වියදම (රු.මි)** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|
| 1 වැඩසටහන - පුනරාවර්තන | 211.02 | 99.97 |
| මූලධන | 37.30 | 85.76 |
| | | |
| 2 වැඩසටහන - පුනරාවර්තන | 3048.92 | 100.0 |
| මූලධන | 524.75 | 66.8 |
| | | |

පුනරාවර්තන වියදම් සැලකීමේදී මෙකී වැඩසටහන් දෙකෙහිම වැඩි දායකත්වයක් දරා ඇත්තේ වැඩසටහන් දෙකෙහිම වන 10752 ක් වූ සේවක මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි යටතේය.

මූලධන වියදම් සැලකීමේදී පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් සඳහා වැඩසටහන් දෙක යටතේම වැඩි දායකත්වයක් දරා ඇත. විශේෂයෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන පුනරුත්ථාපනය කිරීමේ කටයුතු සඳහා රු.මි.75.75 ක් 2012 වර්ෂයේ දරා ඇත. එමෙන්ම 2012 වර්ෂයේ දී නියඟයෙන් හානි වූ ජනතාවට සහන සැලසීමේ වැඩසටහන යටතේ රු.මි. 250 ක් වසර මැදදී ලබා දුන් අතර ඉන් රු.මි. 195.2ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 4 ක් මගින් වියදම් දරා ඇත. පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන යටතේ රු.මි. 157.8 ක් වියදම් දරා ඇත. මීට අමතරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ වන සුළු වාරිමාර්ග පුනරුත්ථාපන වැඩසටහන, ජාතික සවිය ගම නැගුම වැඩසටහන ද යටතේ මෙම දෙපාර්තමේන්තුවට ලබා දෙන ලද රු.මි. 178.3 ක මූල්‍ය ප්‍රතිපාදන තුළින්ද වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඉන් අක්මුදල් ප්‍රමාණවත් නොවීම් මතද රු. මි. 70.5 ක වියදමක් දරා ඇත.

- 2012 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාව.

1-1 වැඩ සටහන.

| වැ.වි. අං. | විස්තරය | අනුමත ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | 2012/12/31 දිනට වියදම | ඉතිරි ප්‍රතිපාදන | % |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| 1001 | වැටුප් හා වේතන | 116,000,000.00 | 117,010,000.00 | 117,009,661.59 | 338.41 | 100.00 |
| 1002 | අති කාල හා නිවාඩු දින වැටුප් | 4,500,000.00 | 4,210,000.00 | 4,185,457.93 | 24,542.07 | 99.42 |
| 1003 | වෙනත් දීමනා | 42,500,000.00 | 55,949,350.00 | 55,947,444.10 | 1,905.90 | 100.00 |
| | | **163,000,000.00** | **177,169,350.00** | **177,142,563.62** | **26,786.38** | **99.98** |
| | | | | | | |
| 1101 | ගමන් වියදම්-දේශීය | 2,000,000.00 | 1,100,000.00 | 1,090,171.60 | 9,828.40 | 99.11 |
| 1102 | ගමන් වියදම්-විදේශීය | 500,000.00 | 659,000.00 | 658,075.13 | 924.87 | 99.86 |
| | | **2,500,000.00** | **1,759,000.00** | **1,748,246.73** | **10,753.27** | **99.39** |
| | | | | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කා/උපකරණ | 3,200,000.00 | 3,143,000.00 | 3,140,265.48 | 2,734.52 | 99.91 |
| 1202 | ඉන්ධන හා ලිහිසි තෙල් | 7,000,000.00 | 7,171,000.00 | 7,170,033.91 | 966.09 | 99.99 |
| 1203 | නිළ ඇඳුම් | 450,000.00 | 525,800.00 | 525,633.40 | 166.60 | 99.97 |
| | | **10,650,000.00** | **10,839,800.00** | **10,835,932.79** | **3,867.21** | **99.96** |
| | | | | | | |
| 1301 | වාහන නඩත්තු | 6,500,000.00 | 4,670,000.00 | 4,668,021.42 | 1,978.58 | 99.96 |
| 1302 | යන්ත්‍රෝපකරණ නඩත්තු | 60,000.00 | 600,000.00 | 590,399.90 | 9,600.10 | 98.40 |
| 1303 | ගොඩනැගිලි නඩත්තු | 1,000,000.00 | 305,000.00 | 301,090.40 | 3,909.60 | 98.72 |
| | | **8,100,000.00** | **5,575,000.00** | **5,559,511.72** | **15,488.28** | **99.72** |
| | | | | | | |
| 1401 | ප්‍රවාහන | 1,400,000.00 | 515,000.00 | 512,903.22 | 2,096.78 | 99.59 |
| 1402 | තැපැල් හා විදුලි සංදේශනය | 2,600,000.00 | 2,665,650.00 | 2,665,611.21 | 38.79 | 100.00 |
| 1403 | විදුලිය හා ජලය | 4,200,000.00 | 4,407,800.00 | 4,407,508.42 | 291.58 | 99.99 |
| 1404 | බදු හා වරිපනම් | 500,000.00 | 407,000.00 | 406,000.80 | 999.20 | 99.75 |
| 1405 | වෙනත් | 6,000,000.00 | 6,027,900.00 | 6,027,796.54 | 103.46 | 100.00 |
| | | **14,700,000.00** | **14,023,350.00** | **14,019,820.19** | **3,529.81** | **99.97** |
| | | | | | | |
| 1506 | දේපළ ණය පොලී | 1,500,000.00 | 1,712,500.00 | 1,712,389.19 | 110.81 | 99.99 |
| | | 1,500,000.00 | 1,712,500.00 | 1,712,389.19 | 110.81 | 99.99 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | එකතුව | **20,045,000.00** | **211,079,000.00** | **211,018,464.24** | **60,535.76** | **99.97** |
| | | | | | | |
| | මූලධන | | | | | |
| 2001 | ගොඩනැගිලි පුනරුත්තාපන | 22,000,000.00 | 22,000,000.00 | 18,644,888.13 | 3,355,111.87 | 84.75 |
| 2003 | වාහන පුනරුත්තාපන | 12,500,000.00 | 12,500,000.00 | 10,384,492.96 | 2,115,507.04 | 83.08 |
| | | **34,500,000.00** | **34,500,000.00** | **29,029,381.09** | **5,470,618.91** | **84.14** |
| | | | | | | |
| 2102 | ගෘහ භාණ්ඩ හා කා /උපකරණ | 6,000,000.00 | 6,000,000.00 | 5,293,034.04 | 706,965.96 | 88.22 |
| | | | | | | |
| 2401 | හැකියා හා පුහුණු | 3,000,000.00 | 3,000,000.00 | 2,982,425.75 | 17,574.25 | 99.41 |
| | මූලධන එකතුව | 43,500,000.00 | 43,500,000.00 | 37,304,840.88 | 6,195,159.12 | 85.76 |
| | | | | | | |
| | 1-1මුළු එකතුව | **243,950,000.00** | **254,579,000.00** | **248,323,305.12** | **6,255,694.88** | **97.54** |

## 2-2 වැඩටහන

| වැය විෂය අංකය | විස්තරය | අනුමත ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | 2012/12/31 දිනට වියදම | ඉතිරි ප්‍රතිපාදන | % |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| 1001 | වැටුප් හා වේතන | 2,010,000,000.00 | 1,911,950,000.00 | 1,911,948,394.10 | 1,605.90 | 100.00 |
| 1002 | අති කාල හා නිවාඩු දින වැටුප් | 7,000,000.00 | 7,000,000.00 | 6,956,322.02 | 43,677.98 | 99.38 |
| 1003 | වෙනත් දීමනා | 800,000,000.00 | 1,007,454,000.00 | 1,007,453,912.01 | 87.99 | 100.00 |
| | | **2,817,000,000.00** | **2,926,404,000.00** | **2,926,358,628.13** | **45,371.87** | **100.00** |
| | | | | | | |
| 1101 | ගමන් වියදම්-දේශීය | 60,000,000.00 | 34,170,000.00 | 34,164,431.75 | 5,568.25 | 99.98 |
| 1102 | ගමන් වියදම්-විදේශීය | 500,000.00 | 141,000.00 | 139,010.00 | 1,990.00 | 98.59 |
| | | **60,500,000.00** | **34,311,000.00** | **34,303,441.75** | **7,558.25** | **99.98** |
| | | | | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කා/උපකරණ | 12,000,000.00 | 10,370,000.00 | 10,365,365.75 | 4,634.25 | 99.96 |
| 1202 | ඉන්ධන හා ලිහිසි තෙල් | 10,500,000.00 | 10,100,000.00 | 1,009,824.56 | 1,751.44 | 99.98 |
| | | **22,500,000.00** | **20,470,000.00** | **20,463,614.31** | **6,385.69** | **99.97** |
| 1301 | වාහන නඩත්තු | 6,200,000.00 | 4,550,000.00 | 4,541,991.60 | 8,008.40 | 99.82 |
| 1302 | යන්ත්‍රෝපකරණ නඩත්තු | 1,000,000.00 | 880,000.00 | 877,131.83 | 2,868.17 | 99.67 |
| 1303 | ගොඩනැගිලි නඩත්තු | 500,000.00 | 288,000.00 | 281,650.50 | 6,349.50 | 97.80 |
| | | **7,700,000.00** | **5,718,000.00** | **5,700,773.93** | **17,226.07** | **99.70** |
| | | | | | | |
| 1402 | තැපැල් හා විදුලි සංදේශනය | 6,000,000.00 | 5,085,000.00 | 5,083,940.52 | 1,059.48 | 99.98 |
| 1403 | විදුලිය හා ජලය | 5,000,000.00 | 4,150,000.00 | 4,147,660.71 | 2,339.29 | 99.94 |
| 1404 | බදු හා වරිපනම් | 400,000.00 | 360,000.00 | 356,627.94 | 3,372.06 | 99.06 |
| 1405 | වෙනත් | 11,500,000.00 | 10,300,000.00 | 10,298,557.94 | 1,442.06 | 99.99 |
| | | **22,900,000.00** | **19,895,000.00** | **19,886,787.11** | **8,212.89** | **99.96** |
| | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1506 | දේපළ ණය පොලී | 35,000,000.00 | 42,203,000.00 | 42,201,783.94 | 1,216.06 | 100.00 |
| | | 35,000,000.00 | 42,203,000.00 | 42,201,783.94 | 1,216.06 | 100.00 |
| | එකතුව | **2,965,600,000.00** | **3,049,001,000.00** | **3,048,915,029.17** | **85,970.83** | **100.00** |
| | | | | | | |
| | මූලධන | | | | | |
| 2001 | ගොඩනැගිලි පුනරුත්තාපන | 100,000,000.00 | 100,000,000.00 | 75,747,026.83 | 24,252,973.17 | 75.75 |
| 2002 | යන්ත්‍රෝපකරණ පුනරුත්තාපන | 18,000,000.00 | 18,000,000.00 | 8,100,323.95 | 9,899,676.05 | 45.00 |
| 2003 | වාහන පුනරුත්තාපන | 20,000,000.00 | 20,000,000.00 | 16,180,626.12 | 3,819,373.88 | 80.90 |
| | | **138,000,000.00** | **138,000,000.00** | **100,027,976.90** | **37,972,023.10** | **72.48** |
| | | | | | | |
| 2102 | ගෘහ භාණ්ඩ හා කා /උපකරණ | 25,000,000.00 | 35,000,000.00 | 34,574,261.53 | 425,738.47 | 98.78 |
| 2103 | යන්ත්‍රෝපකරණ | 25,000,000.00 | 25,000,000.00 | 12,202,047.00 | 12,797,953.00 | 48.81 |
| 2104 | ගොඩනැගිලි | 40,000,000.00 | 40,000,000.00 | 21,061,839.35 | 18,938,160.65 | 52.65 |
| | | **90,000,000.00** | **100,000,000.00** | **67,838,147.88** | **32,161,852.12** | **67.84** |
| | | | | | | |
| .0-2502 | විශේෂ සහන ව්‍යාපෘතිය | 250,000,000.00 | 250,000,000.00 | 195,157,500.58 | 54,842,499.42 | 78.06 |
| | | | | | | |
| 8-2104 | පොහොර ගබඩා ඉදිකිරීම | 2,600,000.00 | 2,600,000.00 | 2,591,745.26 | 8,254.74 | 99.68 |
| | | | | | | |
| 10-2502 | පුරන් කුඹුරු | 280,000,000.00 | 280,000,000.00 | 157,824,868.37 | 122,175,131.63 | 56.37 |
| | | | | | | |
| 11-2502 | දැයට කිරුළ | 25,000,000.00 | 15,000,000.00 | 1,312,891.19 | 13,687,108.81 | 08.75 |
| | මූලධන එකතුව | 785,600,000.00 | 785,600,000.00 | 524,753,130.18 | 260,846,869.82 | 66.80 |
| | 2-2 මුළු එකතුව | **3,751,200,000.00** | **3,834,601,000.00** | **3,573,668,159.35** | **260,932,840.65** | **93.20** |

# 8. අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශයේ මාණ්ඩලීක නිලධාරී තනතුර ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙසින් 2012.11.05 දින සිට 1 වන පංතියේ තනතුරක් බවට පත් කර ඇත.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයට අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 14 දෙනෙකි. 2012 වර්ෂයේ ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

| | |
|---|---|
| රා.ක.ස.සේ. –I | - 01 |
| රා.ක.ස.සේ. –I II | - 04 |
| සංවර්ධන සහකාර | - 04 |
| කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර | - 03 |
| ගොවිබැංකු සහකාර | - 01 |

මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කළ සංවර්ධන සහකාර,කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර නිලධාරීන් 37 දෙනෙකු 2010.06.16 දින සිට මෙම අංශයට අනුයුක්ත කර ඇත. ඒ අනුව 2012 වර්ෂයේදී නිධාරීන් 13 දෙනෙකු ප්‍රධාන කාර්යාලයේද 35 දෙනෙකු දිස්ත්‍රික් කාර්යාල වලද සේවය කරන ලදී. ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල වල සිට සේවයේ යොදන නිලධාරීන්ද වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව රාජකාරී සිදු කර අදාල වාර්තා ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කරනු ලබයි.

වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව පහත පරිදි විගණන පරීක්ෂණ 137ක් සිදු කර ඇත.

**අභ්‍යන්තර විගණන පරීක්ෂණ සම්බන්ධ විස්තර**

| | |
|---|---|
| නුවරඑළිය | 03 |
| මහනුවර | 15 |
| පුත්තලම | 03 |
| අනුරාධපුරය | 17 |
| හම්බන්තොට | 03 |
| ගම්පහ | 07 |
| ගාල්ල | 14 |
| මොනරාගල | 02 |
| කළුතර | 07 |
| මාතලේ | 14 |
| රත්නපුර | 09 |
| කෑගල්ල | 07 |
| කොලඹ | 02 |
| කුරුණෑගල | 04 |
| බදුල්ල | 10 |
| මාතර | 13 |
| | 130 |
| විශේෂ පරීක්ෂණ | 07 |
| | 137 |

2012.11.01 දින සිට විගණකාධිපති විගණන විමසුම් සදහා පිළිතුරු සම්බන්ධිකරණ කාර්යය ගිණුම් අංශය වෙත පවරා ඇත.

# 9. ඵලදා වර්ධන හා අලෙවි අංශය.

ශ්‍රී ලාංකීය ගොවිජන සමාජය සහ සියලු කෘෂිකාර්මික ඉඩම්වල තිරසාර සංවර්ධනය තම දැක්ම කරමින් බිහිවූ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම කාර්යය වූ කෘෂි ඉඩම් කළමනාකරණය තම අංශයේද ප්‍රධානතම කාර්යය කර ගනිමින් කෘෂි ඉඩම් සඳහා මනා කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දී එමගින් උපරිම අස්වැන්නක් රටට ලබාදීම තම අංශයේ ප්‍රමුඛතම ඉලක්කය කර ගනිමින් 2012 වර්ෂයේදි ඵලදා අලෙවි අංශය තම ගමන් මග ඇරඹීය.

## 9.1 කුඹුරු ඉඩමක් වෙනත් කාර්යයක් සඳහා යෙදවීම/ කුඹුරු ඉඩමක් නොවන බවට සහතිකයක් නිකුත් කිරීම.

කිසිසේත් වගාකළ නොහැකි කුඹුරු ඉඩම් වගාවක් නොවන වෙනත් කාර්යයක් සඳහා යොදවා ගැනීම සඳහා දිනපතා පුද්ගලයින් වෙතින් ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය 2012 වර්ෂය වන විට වැඩි වෙමින් පවතින බව හඳුනා ගැනිණි.

ඒ හේතුවෙන්; පුද්ගලයකු විසින් කරනු ලබන එවැනි ඉල්ලීමක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී අප විසින් සලකා බැලිය යුතු කරුණු මොනවාද යන්න පිළිබඳ විධිමත් ආකෘති පත්‍රයක් සකස් කෙරිණ.

යම් පුද්ගලයකු තමාට අයත් ඉඩමක් ; කුඹුරු ඉඩමක් නොවන බවට සහතිකකර දෙන ලෙසට අප වෙතින් කරන ලද ඉල්ලීමකදී ද ඒ සම්බන්ධයෙන් අප විසින් සලකා බැලිය යුතු කරුණු මොනවාද යන්න පිළිබඳව නිශ්චිත ආකෘති පත්‍රයක් පිළියෙල කෙරිණ.

**ඉහත ආකෘති පත්‍ර දෙක පිළියෙල කිරීමට ප්‍රධානතම හේතුව වූයේ**

I. එතෙක් පැවති ක්‍රමවේද තුළ ; තීරණ ගැනීම සඳහා පදනම් කර ගත් වාර්තා දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වෙතින් හෝ අදාල පුද්ගලයන් / ආයතන වෙතින් ගෙන්වාගෙන ඇත්තේ අවස්ථාවන් කිහිපයකදී වීමත්

II. එය තීරණ ගැනීම ප්‍රමාදවීමට හේතුවක් වන අතර එමඟින් පුද්ගලයන් අපහසුතාවයට පත්වීමට හා ඔවුන් දෙපාර්තමේන්තුව කෙරෙහි ඇති කර ගන්නා ප්‍රතිරූපය අයහපත් වීමට බලපාන නිසාත්ය.

❖ **14/2012 චක්‍රෙල්ඛය නිකුත් කිරීම .**

තෙත් කලාපයේ වී වගා කිරීමෙන් ඵලදායිතාවයක් නොමැති කුඹුරු ඉඩම්වල කෙටිකාලීන අතිරේක භෝග වගා කිරීම සඳහා යෝජිත වැඩපිළිවෙල සම්බන්ධයෙන් වන චක්‍රලේඛයක් සකස් කිරීම සඳහා සාකච්ඡාවක් 2012.11.06 දින ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණ.

එම සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස 2012.11.29 දාතමින් අංක 7/11/9/14 යටතේ 14/2012 චක්‍රලේඛය අදාල දිස්ත්‍රික් භාර (කොළඹ, ගම්පහ, කළුතර, රත්නපුර, කෑගල්ල, කුරුණෑගල, ගාල්ල, මහනුවර, නුවරඑළිය, මාතලේ, බදුල්ල) නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් වෙත ඉදිරිපත්කර ඇත.

වී වගා කළ නොහැකිව පුරන්ව ඉතිරිවී ඇති කුඹුරු ඉඩම් කෘෂිකාර්මික භාවිතයෙන් තොරව තෙත් කලාපය තුළ තව දුරටත් පුරන්ව පැවතීම කඩිනමින් විසඳිය යුතු ගැටලුවක් බැවින් 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 30(2) හා 30(3) වගන්ති උපයෝගී කරගනිමින් මෙම චක්‍රලේඛය නිකුත් කිරීමට තීරණය කරන ලදී.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ,එකඟතාවය ඇතිව නිකුත්කරන ලද මෙම චක්රලේඛය දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ බලතල දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් වෙත පවරා දී ඇත.

❖ **15/2012 චක්‍රෙල්ඛය නිකුත් කිරීම .**

14/2012 චක්‍රලේඛය අදාල නොවන්නාවූ ශ්‍රී ලංකාවේ වියළි කලාපය ආවරණය කරන අනෙකුත් දිස්ත්‍රික්කවල පිහිටා ඇති කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් ද වී හැර කෙටිකාලීන භෝග (අර්ධ වාර්ෂික හෝ කන්න භෝග) භෝග වගා කිරීම සඳහා අවසර ලබාදිය යුතු විශේෂ අවස්ථා එළඹෙන බැවින් , එවැනි අවස්ථාවලදී ක්‍රියා කළ යුතු ආකාරය සම්බන්ධයෙන් දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් වෙත උපදෙස් දීම සඳහා අංක 7/11/9/21 හා 2012.12.12 දාතමින් 15/2012 චක්‍රලේඛය නිකුත්කර ඇත.

එසේම දිවයිනේ සියලුම දිස්ත්‍රික්කවල සාර්ථකව වී වගා කළ නොහැකි බව තහවුරු වන කුඹුරු ඉඩම්වල මිරිදිය මසුන් ඇති කිරීම සඳහා ඉදිරිපත් වන යෝජනා සම්බන්ධයෙන් ද 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 34(1) වගන්තිය යටතේ අනුමැතිය ලබාදීමට මෙම චක්‍රලේඛය මත පදනම්ව හැකියාව ඇති අතර එකී අනුමැතිය ලබාදීමේ බලතල ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා සතුව පමණක් පවතී.

❖ **පුරන්වූ කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවසර ඉල්ලීම පාලනය කිරීම සහ නිශ්කාර්ය කුඹුරු ඉඩම් උපරිම ඵලදායිතාවයෙන් යුතුව වගාවන් සඳහා යොදවා ගැනීම සඳහා සියලුම දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් වෙත උපදෙස් ලබාදීම.**

ශ්‍රී ලංකාව තුළ වී හෝ වෙනත් කන්න භෝග වගාව සඳහා යොමු කළ හැකි කුඹුරු ඉඩම් ඒ සඳහා යොදවා නොගෙන වෙනත් සංවර්ධන කාර්යයන් සඳහා යොදවා ගැනීමේ ප්‍රවණතාවය දිගින් දිගටම පැවතුණහොත් වී වගා කළ හැකි කුඹුරු ඉඩම් බහුතරයක් වී වගාවකින් තොරවම රටට අහිමිවී යයි.

ඊට අමතරව දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම් වලදී අතිගරු ජනාධිපතිතුමන් විසින් කිසිදු කුඹුරු ඉඩමක් ගොඩකිරීම සඳහා අවසර ලබා නොදෙන ලෙසට උපදෙස් ලබාදී ඇති බැවින් සහ ;

**මහින්ද චින්තන වැඩසටහනේ** සඳහන් **" ආහාර සුරක්ෂිතතාවය"** යන සංකල්පය මුදුන් පමුණුවා ගැනීමේදී ; වී වගාව සඳහා යොදා නොගෙන පුරන්වීමට ඉඩහැර ඇති කුඹුරු ඉඩම් සංවර්ධනය කිරීමට අවසර ලබාදීම ගැටළු සහගත තත්ත්වයක් බැවින් ;

එකී සෑම කුඹුරු ඉඩමක්ම 4/2009 චක්‍රලේඛයේ සඳහන් උපදෙස් ප්‍රකාරව වී වගාව සඳහාම යොදා ගැනීමට හෝ නැතහොත් ; 14/2012 සහ 15/2012 චක්‍රෙල්ඛ වල උපදෙස් ප්‍රකාරව වෙනත් කෙටි කාලීන/ අර්ධ වාර්ෂික බෝග හෝ මිරිදිය මත්ස්‍ය වගාව සඳහා යොදා ගැනීමට කටයුතු කරන ලෙසට අංක 7/11/9/14 හා 2013.01.17 දාතම දරණ ලිපිය මඟින් සියලුම දිස්ත්‍රික්භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් වෙත උපදෙස් ලබාදී ඇත.

❖ **යම් ඉඩමක් කුඹුරු ඉඩමක් නොවන බවට නිර්දේශ කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු**

හිතා මතා කුඹුරු ඉඩම් වලට අපද්‍රව්‍ය බැහැර කරමින් , ගොඩනැගිලි කඩා ඉවත් කරන සුන්බුන් එකතු කිරීමෙන් හෝ වාරි පද්ධති / ඇළ මාර්ග විනාශ කරමින් කුඹුර වගා කළ නොහැකි තත්වයක් ඇති කරමින් එය පුරන් වීමට ඉඩ හැර පසු කාලයකදී එය ගොඩ ඉඩමක් සේ පෙන්නුම් කරමින් එකී ඉඩමට කුඹුරු ඉඩමක් නොවන බවට සහතිකයක් ලබා ගැනීම සඳහා පුද්ගලයින් වර්තමානයේ පෙළඹ සිටින බව පෙනේ.

එබැවින් 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ (28) වගන්තිය ප්‍රකාරව යම් කුඹුරු ඉඩමක් කුඹුරු ඉඩමක් නොවන බවට නිර්දේශ කිරීමේදී ;

I. එකී කුඹුරු ඉඩම සිතා මතා පුරන්වීමට ඉඩහැර ගොඩ ඉඩමක් බවට පරිවර්තනය කර ඇත්ද යන්න පිළිබඳවත්

II. දැනට කුඹුරු ඉඩමක් ලෙස භාවිතා නොකළද ; එකී ඉඩම විශේෂිත ජල රැඳවුම් ප්‍රදේශයක්ද යන්න හෝ අධික වර්ෂා සමයන්හි ජලය එක්රැස් වන පහත් බිමක්ද යන්න පිළිබඳවත්

III. තෙත් බිම් , වගුරු බිම්, පහත් බිම් හා කුඹුරු යන පරිසර පද්ධති ඉතා වැදගත් පාරිසරික මෙහෙයන් රාශියක් නිහඬව ඉටුකරනු ලබන අතර; වැසි ජලය තාවකාලිකව රඳවා ගැනීම , දූෂිත ද්‍රව්‍යයන් උරා ගැනීම , භූගත ජල මට්ටම වැඩි දියුණු කිරීම යනාදී සංසිද්ධි ගණනාවකටද ඉවහල්වන බැවින් ඒ සම්බන්ධයෙන්ද විශේෂ අවධානය යොමු කළ යුතු බවට සියලුම දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් වෙත උපදෙස් ලබාදී ඇත.

# 10. ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය

කෘෂිකර්මාන්තය සිය ප්‍රධාන ජීවිකාව කරගත්, මෙරට ග්‍රාමීය දිළිඳු ගොවින්ගේ ණය අවශ්‍යතා සපුරාලීම හා ඔවුන්ගේ ඉතිරි කිරීම් ඉහළ නැංවීම මගින් ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහල තලයකට ගෙන ඒම පෙරදැරි කරගනිමින්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 1998 වර්ෂයේදී ගොවිජන සංවර්ධන/ ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් වශයෙන් ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

ගොවිජන සේවා කාරක සභාවේ නියෝජිතයන්ගෙන් සමන්විත ණය පාලන කමිටුවක් මගින් ගොවිජන බැංකුවේ මූල්‍ය හා සාමාන්‍ය පරිපාලන කටයුතු ඉටු කරන අතර, ගොවිජනසේවා මධ්‍යස්ථානයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී එහි මූලික වගකීම දරයි. අදාල දිස්ත්‍රික්කය පුරා පිහිටුවා ඇති සියළුම ගොවිජන බැංකු කටයුතු පිළිබඳ අධීක්ෂණය හා මෙහෙයවීම දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්ගේ වගකීම වේ. ගොවිජන බැංකු ක්‍රියාවලියේ සමස්ථ වගකීම ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් සතුවේ.

- ගොවිජන බැංකුවේ දැක්ම
  "ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසාර සංවර්ධනය සහතික කෙරෙන මූල්‍ය සංස්කෘතියක්"

- ගොවිජන බැංකුවේ මෙහෙවර
  "ස්වශක්තියෙන් හෙබි අභිමානවත් ගොවිජන සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය කෙරෙන මූල්‍ය ශක්තිය එම සමාජය තුළ ස්ථාපිත කිරීම සඳහා ගොවි ජනතාව සංවිධානය කිරීම, සවිබල ගැන්වීම, ආයතනික ව්‍යුහයන් සංවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම."

- විශේෂ අරමුණ

  මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 81 පිටුවේ සඳහන් පරිදි "ගොවිජන බැංකු ක්‍රමය තවදුරටත් ශක්තිමත් කර ගොවියාට අවශ්‍ය සියළු ණය ගොවිජන බැංකු ක්‍රමය මගින් ලබා දීමට කටයුතු කරමි " යන ප්‍රකාශය යථාර්තවත් කිරීම.

- ගොවිජන බැංකුවේ අභිමතාර්ථ

  1. ග්‍රාමීය ජනතාවගේ දිළිඳුකම තුරන් කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය මූල ධනය සපයා ගැනීමට සහාය වන ආයතනයක් ලෙස කටයුතු කිරීම.
  2. ගොවි ජනතාවගේ ඉතිරි කිරීම් නැම්යාව වර්ධනය කර ගැනීම හා ඒ තුළින් ඔවුන්ගේ ආයෝජන ශක්තිය වර්ධනය කිරීමට සහාය වීම.
  3. යැපුම් මට්ටමේ කෘෂිකර්මාන්තය වාණිජමය මට්ටමකට පත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සහ උපදේශාත්මක පහසුකම් සලසා දීම.
  4. ගොවි ජනතාව සංවිධාන ගතකර ඔවුන්ගේ මූල්‍ය හා ආර්ථික ශක්තිය වර්ධනය කර ගැනීමට අවකාශ සැලසීම.
  5. ගොවි ජනතාව සමාජීය වශයෙන් බලවත් සමාජ ස්ථරයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය කෙරෙන මූල්‍ය පරිසරය ගොඩනැගීම සහ ඔවුන්ගේ සුභසාධන කටයුතු සඳහා දායක වීම.
  6. ගොවි ජනතාව සතු මුදල් සහ ප්‍රාග්ධනය එම ජනතාව අතරම සංසරණය වීමට අවකාශ සැලසීම මඟින් ගොවි ආර්ථිකය ප්‍රසාරණය කිරීම.
  7. ගොවි සංවිධාන ශක්තිමත්කර කෘෂි කර්මාන්තය පාදක කර ගත් ව්‍යාපාර සඳහා ඔවුන්ට අවශ්‍ය මූල්‍ය ශක්තිය ලබා දීම.
  8. ලොකු ළූණු, මුං, සෝයා ආදී දැනට විශාල වශයෙන් ආනයනය කරන බෝග වගාවන් සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම තුළින් එම වගාවන් බහුල කිරීම හා එමගින් ජාතික ආර්ථිකයට ශක්තියක් සැපයීම.

## 10.1 2012.12.31 දිනට දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවා ඇති ගොවිජන බැංකු (නියමු)

**ව්‍යාපෘති සංඛ්‍යාව**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ගොවිජන සේවා මධ්‍යස්ථාන ගණන | පිහිටුවා ඇති ගොවිජන බැංකු ගණන |
|---|---|---|---|
| 01 | කොළඹ | 8 | **7** |
| 02 | ගම්පහ | 26 | **26** |
| 03 | කළුතර | 20 | **19** |
| 04 | මහනුවර | 45 | **45** |
| 05 | මාතලේ | 23 | **23** |
| 06 | නුවරඑළිය | 22 | **22** |
| 07 | ගාල්ල | 33 | **33** |
| 08 | මාතර | 22 | **22** |
| 09 | හම්බන්තොට | 16 | **16** |
| 10 | කුරුණෑගල | 55 | **55** |
| 11 | පුත්තලම | 18 | **18** |
| 12 | අනුරාධපුරය | 41 | **41** |
| 13 | පොලොන්නරුව | 13 | **11** |
| 14 | බදුල්ල | 31 | **31** |
| 15 | මොණරාගල | 18 | **17** |
| 16 | රත්නපුරය | 30 | **30** |
| 17 | කෑගල්ල | 14 | **14** |
| 18 | අම්පාර | 29 | **28** |
| 19 | ත්‍රිකුණාමලය | 22 | **15** |
| 20 | මඩකලපුව | 17 | **12** |
| 21 | වවුනියාව | 8 | **6** |
| 22 | යාපනය | 15 | **15** |
| 23 | මන්නාරම | 12 | **8** |
| 24 | මුලතිව් | 10 | **10** |
| 25 | කිලිනොච්චිය | 8 | **5** |
| | **එකතුව** | **557** | **529** |

2012 වර්ෂයේදී මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවිජන බැංකු 06 ක් ආරම්භ කරන ලදී.

එම ගොවිජන බැංකු,

1. ඕලුමඩු
2. පුල්ලියවලෙයි
3. පුදුකුඩිරිප්පු
4. උඩයාකට්ටු
5. අලම්පිල්
6. කොක්කුතොඩුවෙයි

## 10.2 ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතියේ ගනුදෙනු කරන සාමාජිකයින් පිළිබඳ විස්තර

කොටස්කරුවන් සංඛ්‍යාව - 387750

තැන්පත්කරුවන් සංඛ්‍යාව - 180517

කණ්ඩායම් ගිණුම් සංඛ්‍යාව - 29519

## 10.3 2012.12.31 දිනට ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතියේ මූල්‍ය තොරතුරු.

| විස්තරය | | ශේෂය (රු.) |
|---|---|---|
| ඉතිරි කිරීම් හා ස්ථාවර ගිණුම් | | 359,287,140 |
| ජංගම ගිණුම | | 34,361,432 |
| අත ඉතිරි | | 2,558,272 |
| ණය ගැතියෝ | | 628,265,120 |
| ගොවීන්ගේ කොටස් මුදල් පාලන ගිණුම | | 176,440,022 |
| ප්‍රාග්ධන ගිණුම | | 149,468,737 |
| ගොවීන්ගේ ඉතිරි කිරීම් පාලන ගිණුම | | 237,328,620 |
| ගොවීන්ගේ කණ්ඩායම් පාලන ගිණුම | | 73,549,123 |

### 10.3.1 ගොවිජන බැංකුව මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ණය යෝජනා ක්‍රම:

- වගා ණය (කෘෂි ණය)
- අස්වනු නෙලිමේ ණය
- අස්වනු සුරැකීමේ ණය
- කෘෂි යන්ත්‍රෝපකරණ ණය
- ව්‍යාපෘති ණය
- ගෙවතු වගා ණය
- ගොවි විශ්‍රාම වැටුප් ණය
- ඇසුරුම් මිලදී ගැනීමේ ණය

### 10.3.2 ගොවිජන බැංකු ආරම්භයේ සිට 2012.12.31 දක්වා ගොවිජන බැංකු මගින් ණය නිකුත් කිරීම් හා අයවීම් ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | ණය මුදල | ණයකරුවන් ගණන | අයකරගත් මුදල | අයවීමේප්‍රතිශතය |
|---|---|---|---|---|
| කොළඹ | 52,071,121 | 4,670 | 42,173,447 | 81% |
| ගම්පහ | 173,074,624 | 11,380 | 143,111,818 | 83% |
| කළුතර | 54,567,691 | 9,605 | 44,817,330 | 82% |
| මහනුවර | 320,096,340 | 37,613 | 251,318,763 | 79% |
| මාතලේ | 237,832,089 | 26,405 | 202,702,145 | 85% |
| නුවරඑළිය | 234,633,489 | 25,588 | 179,150,109 | 76% |

| | | | | |
|---|---|---|---|---|
| ගාල්ල | 168,606,299 | 21,425 | 137,974,047 | 82% |
| මාතර | 93,419,255 | 9,395 | 70,372,279 | 75% |
| හම්බන්තොට | 109,878,894 | 9,473 | 97,073,331 | 88% |
| කුරුණෑගල | 356,114,391 | 40,314 | 297,906,077 | 84% |
| පුත්තලම | 197,840,260 | 23,674 | 166,863,917 | 84% |
| අනුරාධපුරය | 564,431,463 | 45,599 | 505,877,548 | 90% |
| පොලොන්නරුව | 554,676,963 | 51,950 | 535,208,021 | 96% |
| බදුල්ල | 339,210,365 | 35,614 | 281,432,670 | 83% |
| මොණරාගල | 84,096,712 | 11,329 | 60,621,968 | 72% |
| රත්නපුරය | 133,948,817 | 7,656 | 91,341,279 | 68% |
| කෑගල්ල | 138,933,461 | 8,879 | 102,162,283 | 74% |
| අම්පාර | 103,357,223 | 12,213 | 91,785,783 | 89% |
| ත්‍රිකුණාමලය | 418,043 | 358 | 212,998 | 51% |
| මඩකලපුව | 15,890,000 | 947 | 11,500,000 | 72% |
| වවුනියාව | 16,470,000 | 710 | 13,815,000 | 84% |
| යාපනය | 71,936,000 | 3,434 | 45,162,600 | 63% |
| මන්නාරම | 3,835,000 | 279 | 816,500 | 21% |
| මුලතිව් | 28,995,000 | 818 | 19,493,125 | 67% |
| කිලිනොච්චි | 2,920,000 | 166 | 998,000 | 34% |
| **එකතුව** | **4,054,333,500** | **399,328** | **3,392,893,037** | **84%** |

2011 වර්ෂයේදී ආරම්භ කරන ලද රු. 100,000/- ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් ගොවිජන බැංකු 100 ට අමතරව 2012 වර්ෂයේදී රු. 100,000/- යේ ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් ගොවිජන බැංකු ද ඇතුළත්ව 2012.12.31 දින වන විට රු. 100,000/- ණය ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තෝරාගත් මුළු ගොවිජන බැංකු සංඛ්‍යාව පහත පරිදි වේ.

| අනු අංකය | තෝරාගත් දිස්ත්‍රික්ක | දිස්ත්‍රික්කයේ ඇති බැංකු ගණන | තෝරාගත් බැංකු ගණන |
|---|---|---|---|
| 01 | කොළඹ | 7 | 5 |
| 02 | ගම්පහ | 26 | 25 |
| 03 | කළුතර | 19 | 5 |
| 04 | මහනුවර | 45 | 25 |
| 05 | මාතලේ | 23 | 21 |
| 06 | නුවරඑළිය | 22 | 18 |
| 07 | ගාල්ල | 33 | 19 |

| | | | |
|---|---|---|---|
| 08 | මාතර | 22 | 3 |
| 09 | හම්බන්තොට | 16 | 3 |
| 10 | කුරුණෑගල | 55 | 9 |
| 11 | පුත්තලම | 18 | 14 |
| 12 | අනුරාධපුරය | 41 | 11 |
| 13 | පොලොන්නරුව | 11 | 9 |
| 14 | බදුල්ල | 31 | 15 |
| 15 | මොණරාගල | 17 | 13 |
| 16 | රත්නපුරය | 30 | 16 |
| 17 | කෑගල්ල | 14 | 13 |
| 18 | අම්පාර | 28 | 12 |
| 19 | ත්‍රිකුණාමලය | 15 | 2 |
| 20 | මඩකලපුව | 12 | 2 |
| 21 | වවුනියා | 6 | 4 |
| 22 | යාපනය | 15 | 2 |
| | **එකතුව** | **506** | **243** |

උතුරු හා නැගෙනහිර පළාත්හි ක්‍රියාත්මක ගොවිජන බැංකුවල දෙමළ මාධ්‍ය රාජකාරීන්හි නියුතු ගොවි නිලධාරින් සඳහා ගොවිජන බැංකු ක්‍රියාවලිය හා ගිණුම් කටයුතු පිළිබඳ දෙමළ මාධ්‍යපුහුණු වැඩමුළු 02 ක් පවත්වන 2012 වර්ෂයේදී පවත්වන ලදී.

ඒ අනුව 2012 වර්ෂයේදී පුහුණු කරන ලද නිලධාරීන් පහත පරිදි වේ.

**පුහුණු කරන ලද මුළු නිලධාරීන් සංඛ්‍යාව - 149**

**පුහුණු වැඩමුළු සඳහා දරණ දල මුළු වියදම - රු. 943,250.50**

# 11. ජල කළමනාකරණ අංශය.

මෙම දෙපාර්තමේන්තුවේ ජල කළමනාකරණ අංශය 1981 වර්ෂයේ ආරම්භ කරන ලදී. දැනට එය ජල කළමනාකරණය පිළිබඳ ඉංජිනේරු වරයෙකුගේ ප්‍රධානත්වයෙනන් ක්‍රියාත්මක වේ.

<u>දැනට තිබෙන මානව සම්පත්</u>

| | ජල කළමනාකරණ අංශය | දුරස්ථ ගෝචර අංශය |
|---|---|---|
| • ඉංජිනේරු | 02 | - |
| • සහකාර අධ්‍යක්ෂ | 01 | - |
| • ඉංජිනේරු සහකාර | 01 | 01 |
| • කාර්මික නිලධාරි | - | 01 |
| • රාජ්‍ය කළමනාකරණ සහකාර | 04 | - |
| • කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර | - | 01 |
| • කාර්යාල කාර්ය සහායක | 01 | |
| • සංවර්ධන සහකාර | - | 01 |

## 11.1 ජල කළමනාකරණ අංශයේ වගකීම

මෙම අංශය ආරම්භ කළේ අත්හැර දමා ඇති වැව් පුනරුත්ථාපනය කිරීමෙන් හා ක්‍රියාත්මක වැව් නවීකරණය කිරීමෙන් ද එසේම එම වැව් වල ක්‍රමානුකූල ජල පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් කෘෂිකර්ම නිෂ්පාදනය වැඩි කිරීමටයි. ඒ සඳහා ක්‍රමවත් ජල පාලන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම කාර්මික නිලධාරීන් හා අනෙකුත් නිළධාරීන් පුහුණු කිරීම ජල කළමනාකරණ පාලන අංශයට පැවරී තිබෙන ප්‍රධාන කාර්යයකි. ඊට අමතරව පහත දැක්වෙන කාර්යයන් 2012 වර්ෂය තුළ ඉටුකර ඇත.

## 11.2 ඉටුකරන ලද කාර්යයන්

### 11.2.1 මොණරාගල දිස්ත්‍රික්කයේ එල්ලංගා වැව් පුනරුත්ථාපනය

| | | | |
|---|---|---|---|
| කර්මාන්ත ගණන | 03 | 01 | (ප්‍රතිපාදන අනුමැතිය ලැබී නැත) |
| | | 02 | අවිච්ඡේද මුදල 8,828,967.22 |

### 11.2.2 වැව් ගැඹුරු කිරීම

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්ක ගණන | 10 | |
| වැව් ගණන | 18 | |
| වියදම | 4,351,890.31 | අවිච්ඡේද මුදල - 11,383,523.29 |

ප්‍රතිලාභ ගොවි පවුල් ගණන 862

වගා කරන ලද අක්කර ගණන 1017

**11.2.3 ක්ෂුද්‍ර වාරි වැඩසටහන**

| | |
|---|---|
| දිස්ත්‍රික්ක ගණන | 08 |
| කර්මාන්ත සංඛ්‍යාව | 12 |
| වියදම | (ඇස්තමේන්තු සකස් කර ටෙන්ඩර් පිරිනමා ඇති අතර, ඉදිකිරීම් කටයුතු 2013 වර්ෂයට ගෙන එන ලදි. |

**11.2.4 තත්ව පාලන කටයුතු**

| | | |
|---|---|---|
| වැව් ගණන | - | 36 |
| තත්ව පාලන පුහුණු වැඩසටහන (ප්‍රයෝගික) | - | (උතුරු හා නැගෙනහිර දිස්ත්‍රික්කවල කාර්මික නිලධාරින් සඳහා ) |

**11.2.5 ගම්බද වාරිමාර්ග යටතේ ජල ප්‍රමිතිය පරීක්ෂා කිරීම**

වර්ෂාව නොමැති කාලවලදී ගම්බද වාරිමාර්ග යටතේ ජල ප්‍රමිතිය පරීක්ෂා කර, අනතුරුදායක තත්වයන් කල් ඇතිව හඳුනා ගැනීමේ වැඩසටහන මෙම වසරේ දී ද ක්‍රියාත්මක කරන ලදි.

**11.2.6 කෘෂි පාරිසරික හා ජලධාරා අත්පොත**

සිංහල මාධ්‍යයෙන් පිලියෙල වූ මෙම පොත් පිටපත් 10,000 ක් 2011 වසරේ දී මුද්‍රණය කල අතර, මෙම වසරේදී මේ සඳහා වන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කල අතර, එසේම දෙමළ හා ඉංග්‍රීසි පොත් මුද්‍රණය කර ඇත.

**11.2.7 ජල කළමනාකරණ නියමු ව්‍යාපෘතිය**

දිවයිනේ වියලි කලාපීය ප්‍රධාන කෘෂි පාරිසරික ප්‍රදේශවල මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

| | |
|---|---|
| දිස්ත්‍රික්ක ගණන | 09 |
| වැව් සංඛ්‍යාව | 17 |

(වැව් ආශ්‍රිත වර්ෂාපතනය, වාෂ්පීකරණය, කුඹුරු වලට ජලය ලබාදෙන ප්‍රමාණය, කාලගුණික දත්ත මැනීම ආදිය).

අදාල කෘෂි පාරිසරික ප්‍රදේශයේ ජල කාර්යක්ෂමතාවය හා ජල ඵලදායීතාවය ගණනය කිරීම මෙහි අරමුණයි.

### 11.2.8 ගොවිජන සේවා මධ්‍යස්ථාන ආශ්‍රිත දෛනික වර්ෂා පතන මාන සවිකිරීම.

| | | |
|---|---|---|
| 2012 වර්ෂයට පෙර සවිකරන ලද වර්ෂා මාපක ගණන | - | 235 |
| 2012 වර්ෂ තුල සපයන ලද වර්ෂා මාපක සංඛ්‍යාව | - | 130 |
| එකතුව | - | 365 |
| | | === |

### 11.2.9 චන්ද්‍රිකා ඡායාරූප ආශ්‍රයෙන් කුඹුරු ඉඩම් සඳහා දත්ත පාදමක් සැකසීම.

**දිස්ත්‍රික්ක**

- ගම්පහ
- පොළොන්නරුව
- මොණරාගල
- ගාල්ල

පුහුණු වැඩ සටහන් ගණන 02 (ගම්පහ දිස්ත්‍රික්කය)

දැනට ගම්පහ දිස්ත්‍රික්කයේ දත්ත රැස්කිරීම හා චන්ද්‍රිකා ඡායාරූප මත කුඹුරු ඉඩම් වල මායිම් ලකුණු කිරීමත්, ග්‍රාම නිලධාරි මායිම්, යාය මායිම් හා ජල මාවත් ලකුණු කිරීමත් සිදු කරනු ලබයි.

දැනට නිමවෙමින් පවතින ප්‍රදේශවලට අදාලව මෙම දත්ත පාදමේ ආකෘතියක් දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුලත් කර ඇත.

මේ සඳහා අවශ්‍ය වන මෘදුකාංග මිලදී ගන්නා ලද අතර, මිනුම්දෝරු දෙපාර්තමේන්තුවෙන් භුමිපාලන ලක්ෂ ලබා ගැනීමටද කටයුතු කරන ලදී.

### 11.2.10 පුහුණු වැඩසටහන්:

කෘෂි පාරිසරික හා ජලධාරා අත්පොත කෘ.ප.නි.ස. වරුන්ට හඳුන්වා දීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරිම - වැඩමුළු 02 ක් මෙම වසර තුලදී පවත්වන ලදී.

මෙම පුහුණු වැඩසටහන සඳහා භාවිතා කිරීමට අවශ්‍ය පුහුණු අත්පොත් හා පුහුණු ආධාරක සැකසීමද කරන ලදි.

ජල කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන ( මහඉලුප්පල්ලම සේවා සං.අ. අයාතනය)

නි.කො., ස.කො., ඉංජිනේරු හා දි.තාක්ෂණ නිලධාරි සඳහා ජල කලමනාකරණය දෙදින වැඩමුළුවක් පැවැත්වීම.

ජල කළමනාකරණ අංශයේ නව නිර්මාණ හඳුන්වාදීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම. (Symposiums)

**11.2.11 වාරිමාර්ග දත්ත පාදම නිර්මාණය කිරීම.**

උතුරු පළාතේ දැනට නිම නොකළ දිස්ත්‍රික්ක සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලදී.

**11.2.12 ගාල්ල දිස්ත්‍රික්කයේ ගංවතුර ප්‍රදේශවල කුඹුරු ඉඩම් වගා කිරීම.**

ගාල්ල දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් මූලික කටයුතු ආරම්භ කරන ලදී.

**11.2.13 වෙනත් ක්‍රියාකාරකම්**

- ජලධාරා සිතියම් පාසල්වලට බෙදාදීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට භාරදීම.
- ජලධාරා ඇල්බමය රාජ්‍ය ආයතනවලට බෙදා හැරීම.

**11.2.14 නවීන උපකරණ මිලදී ගැනීම.**

වැව් වල ජලය පිරී ඇති අවස්ථාවලදී මිනුම් ගැනීම පහසු කරවීම සඳහා අධිතාක්ෂණික මිනුම් උපාංග මිලදී ගැනීම.
(Eco - Sounder with GPS for Deep water surveys)

මිනුම් කටයුතු සඳහා Star fire උපාංග මිලදී ගැනීම.

**11.2.15 හඳුන්වාදීම්**

ශ්‍රී ලංකාවේ විශාලම අමුණු යාන්ත්‍රික දොර ( Mechanical flap gate) හඳුන්වා දීම.
කොළඹ දිස්ත්‍රික්කයේ කොස්ගම ගොවිජන සේවා බලප්‍රදේශයේ තෝරපිටිය අමුණ.

දුරස්ථ ජල උස මාපකය (Remote Water Level Recorder) හඳුන්වා දීම.

හිටපු ගොවිජන සේවා කොමසාරිස් අයි.කේ. වීරවර්ධන මහතා විසින් රචනා කරන ලද “Too many Hands in too few lands” (Thattumaru and Kattimaru) පොත නැවත මුද්‍රණය කර එහි පිටපත දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුලත් කිරීමද මෙම වසර තුලදී කරන ලදී.

******//******

# පුරන් කුඹුරු අස්වැද්දීම 2012 .12.31දිනට ප්‍රගතිය

ඇමුණුම 01

**වැය ශීර්ෂය 281-2-2-10-2502** ප්‍රතිපාදන මුදල රු. **196,500,000.00**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රගතිය වාර්තා කර ඇති දිනය | ව්‍යාපෘති සංඛ්‍යාව | වගා කෙරෙනඅක්කර ගණන | | ප්‍රතිලාභී ගොවි පවුල් ගණන | රු.මි.1ට අඩු | | රු.මි.1ට වැඩි | | 2012.12.31 දිනට නව කර්මාන්ත සඳහා දිස්ත්‍රික්ක වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු. | භෞතික ප්‍රගතිය | | | | මූල්‍ය ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මෙතෙක් වගාකළ | අලුතින් වගා කරන | | ඇස්තමේන්තු සකස් කිරීම | ගොවි සංවිධාන වෙත කර්මාන්ත පැවරීම. | ඇස්තමේන්තු සකස් කිරීම | ගොවි සංවිධාන වෙත කර්මාන්ත පැවරීම. | | 25% ට අඩු ව්‍යාපෘති සංඛ්‍යා | 26% - 50% ව්‍යාපෘති සංඛ්‍යාව | 51%-75% අතර ව්‍යාපෘති සංඛ්‍යාව | 76%-100% අතර ව්‍යාපෘති සංඛ්‍යාව | ගිවිසුම්ගත වටිනාකම රු. | 2012.12.31 දිනට වියදම රු. | මූල්‍ය ප්‍රගතියේ % |
| 1 | කොළඹ | 2012.12.31 | 17 | 136 | 262 | 458 | 14 | 14 | 0 | 0 | 6,024,800.00 | - | 2 | 1 | 14 | 5,910,294.89 | 1,448,027.93 | 25% |
| 2 | ගම්පහ | 2012.12.31 | 34 | 1328 | 413 | 1745 | | | 34 | 34 | 9,069,650.00 | - | - | - | 25 | 9,205,031.81 | 5,218,926.48 | 57% |
| 3 | කළුතර | 2012.12.31 | 10 | | 204 | 427 | 9 | 9 | - | - | 5,000,000.00 | - | 4 | 1 | 5 | 5,559,545.48 | 744,724.33 | 13% |
| 4 | මහනුවර | 2012.10.31 | 11 | 223 | 171 | 442 | 10 | 10 | 1 | 1 | 5,659,313.07 | 1 | - | 1 | 9 | 6,176,518.98 | 3,716,246.11 | 60% |
| 5 | මාතලේ | 2012.12.31 | 3 | 192 | 192 | 241 | 1 | 1 | 2 | 2 | 5,502,364.00 | - | - | - | 3 | 5,456,761.36 | 3,925,780.86 | 72% |
| 6 | නුවරඑළිය | 2012.12.31 | 8 | | 234 | 372 | 7 | 7 | 0 | 0 | 5,000,000.00 | - | - | - | 8 | 4,854,339.54 | 4,819,730.42 | 99% |
| 7 | ගාල්ල | 2012.12.31 | 7 | 57 | 202 | 242 | 7 | 7 | - | - | 5,000,000.00 | - | 1 | - | 6 | 6,036,170.75 | 3,825,680.66 | 63% |
| 8 | මාතර | 2012.12.31 | 9 | 254 | 246 | 326 | 8 | 8 | 1 | 1 | 5,000,000.00 | - | 1 | 1 | 7 | 5,095,683.01 | 1,905,415.13 | 37% |
| 9 | හම්බන්තොට | 2012.12.31 | 10 | 185 | 59 | 223 | 10 | 10 | 0 | 0 | 5,180,000.00 | - | - | - | 11 | 4,918,563.40 | 1,023,297.24 | 21% |
| 10 | යාපනය | 2012.12.31 | 5 | 110 | 47 | 237 | 4 | 4 | 1 | 1 | 5,500,000.00 | - | - | | 4 | 5,094,174.70 | 4,751,053.21 | 93% |
| 11 | වව්නියාව | 2012.12.31 | 6 | 376 | 18 | 344 | 2 | 2 | 4 | 4 | 7,122,810.49 | - | 1 | - | 5 | 9,701,244.10 | 3,996,142.95 | 41% |
| 12 | මුලතිව් | 2012.12.31 | 4 | - | 135 | 99 | 1 | 1 | 3 | 3 | 5,369,796.06 | - | - | 1 | 3 | 5,635,658.44 | 4,668,428.41 | 83% |
| 13 | මන්නාරම | 2012.12.31 | 4 | | | | 2 | 2 | 2 | 2 | 5,000,000.00 | | | 2 | 2 | 4,450,315.14 | 438,722.47 | 10% |
| 14 | කිලිනොච්චි | 2012.12.31 | 1 | - | 126 | 32 | - | - | 1 | 1 | 2,074,778.08 | - | - | - | 1 | 1,971,182.37 | 1,684,423.18 | 85% |
| 15 | මඩකලපුව | 2012.12.31 | 5 | 217 | 442 | 488 | - | - | 5 | 5 | 5,000,000.00 | - | 2 | - | 3 | 5,303,351.90 | 2,556,902.96 | 48% |
| 16 | අම්පාර | 2012.09.30 | 3 | 345 | 90 | 124 | - | | 3 | 3 | 5,368,312.81 | - | 2 | - | - | 5,151,372.23 | 1,673,485.69 | 32% |
| 17 | ත්‍රිකුණාමලය | 2012.12.31 | 4 | 145 | 295 | 204 | 1 | 1 | 3 | 3 | 5,705,519.92 | - | - | - | 4 | 5,526,233.50 | 3,563,992.47 | 64% |
| 18 | කුරුණෑගල | 2012.12.31 | 4 | - | 152 | 99 | 1 | 1 | 3 | 3 | 4,620,785.20 | - | - | - | 4 | 4,982,844.85 | 2,146,416.33 | 43% |
| 19 | පුත්තලම | 2012.12.31 | 8 | 278 | 77 | 281 | 7 | 7 | 1 | 1 | 6,466,744.90 | - | - | - | 8 | 6,505,254.11 | 2,046,702.28 | 31% |
| 20 | අනුරාධපුර | 2012.12.31 | 19 | 701 | 328 | 648 | 10 | 10 | 9 | 9 | 23,712,312.20 | 1 | 4 | 2 | 13 | 22,957,476.74 | 10,051,480.07 | 44% |
| 21 | පො' නරුව | 2012.12.31 | 4 | 139 | 128 | 147 | 1 | 1 | 4 | 4 | 5,527,503.46 | - | - | - | 5 | 5,293,601.84 | 1,674,732.57 | 32% |
| 22 | බදුල්ල | 201.12.31 | 11 | 106 | 89 | 333 | 11 | 11 | 0 | 0 | 5,900,588.13 | - | - | - | 11 | 5,343,862.40 | 5,052,453.47 | 95% |
| 23 | මොණරාගල | 2012.11.15 | 7 | 85 | 145 | 200 | 7 | 7 | - | - | 5,000,000.00 | 2 | 1 | 1 | 3 | 4,311,141.36 | 1,064,799.80 | 25% |
| 24 | රත්නපුරය | 2012.12.31 | 10 | 301 | 97 | 425 | 7 | 7 | 2 | 2 | 6,246,007.97 | - | - | - | 9 | 7,603,793.60 | 5,448,573.38 | 72% |
| 25 | කෑගල්ල | 2012.12.31 | 11 | 124 | 119 | 291 | 7 | 7 | 1 | 1 | 7,514,050.23 | - | - | - | 11 | 7,284,975.43 | 4,718,192.59 | 65% |
| | එකතුව | | 215 | 5302 | 4271 | 8428 | 127 | 127 | 80 | 80 | 157,565,336.52 | 4 | 18 | 10 | 174 | 160,329,391.93 | 82,164,330.99 | 51% |

| | |
|---|---|
| අවිච්ඡේද කර්මාන්ත සඳහා වෙන් කිරීම් | 28,641,300.61 |
| මායිම් ගම්මාන වැව් | 340,000.00 |
| ත්‍රිකුණාමලය දැයට කිරුළ ඉන්ධන සඳහා | 200,000.00 |
| අනුරාධපුර පැවැත්වූ වැඩමුළුවක් සඳහා සංග්‍රහ වියදම් | 10,200.00 |
| ජල කළමණාකරණ අංශය GPS උපකරණ මිලදී ගැනීම | 5,001,920.00 |
| ජල කළමණාකරණ අංශය Auto level උපකරණ මිලදී ගැනීම | 867,000.00 |
| ගොඩනැගිලි ඉදි කිරීම හා වැව් ප්‍රති. (පුවත්පත් දැන්වීම) | 73,920.00 |
| ප්‍රධාන කාර්යාලය ඉන්ධන සඳහා | 3,800,000.00 |
| මුළු වෙන්කිරීම් | 196,499,677.13 |
| **ශේෂය** | 322.87 |

# එල්ලංගා වැව් අලුත් වැඩියා කිරීමේ වැඩසටහන - 2012

ප්‍රගති වාර්තාව - 2012/12/31

ප්‍රතිපාදන : රු.මි. 18.00

වැය ශීර්ෂය : 281-2-2-10-2502-1

| දිස්ත්‍රික්කය | අංකය | ගො.සේ.ම | වැවේ නම | වගා බිම් ප්‍රමාණය (අක්කර) | ගොවි පවුල් ගණන | ඇස්තමේන්තු මුදල (රු.) | සිවිල් වැඩ වටිනාකම (රු.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය | අවිච්ඡේද මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මොණරාගල | 1 | බුත්තල | කුඹුක්ගස්ආර වැව | 19.7 | 50 | 3,500,000.00 | 3,165,591.24 | - | 30% | 8,828,967.22 |
| | 2 | තෙලුල්ල | ඉදිකොලපැලැස්ස වැව | 7.4 | 40 | 6,500,000.00 | 5,663,375.98 | - | 20% | |
| | 3 | තණමල්විල | ගිරිදේවි වැව | 19.7 | 70 | 8,000,000.00 | 6,966,242.95 | ප්‍රසම්පාදන අනුමැතිය ලැබී නොමැත | | |
| | | | | | | | | | | |

# වැව් ගැඹුරු කිරීමේ වැඩසටහන - 2012

## ප්‍රගති වාර්තාව - 2012/12/31

**ප්‍රතිපාදන : රු.මි. 20.00** **වැය ශීර්ෂය : 281-2-2-10-2502-1**

| දිස්ත්‍රික්කය | අංකය | ගො.සේ.ම | වැවේ නම | වගා බිම් ප්‍රමාණය (අක්කර) | ගොවි පවුල් ගණන | ඇස්තමේන්තු මුදල (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු.) | භෞතික ප්‍රගතිය | අවිච්ඡේද මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| කුරුණෑගල | 1 | මොරගොල්ලාගම | රඹෑව මහ වැව | 38 | 52 | 999,390.00 | 626,100.00 | 100% | 909,397.90 |
| | 2 | නාගොල්ලාගම | ගල්ලෑව මහ වැව | 34 | 27 | 749,799.70 | 424,387.50 | 100% | |
| | 3 | රස්නායකපුර | තලාකොළ වැව | 89 | 134 | 948,080.00 | 671,586.00 | 100% | |
| අනුරාධපුර | 4 | ගම්බිරිගස් වැව | ඉහල අඩුකැටියාව වැව | 35 | 42 | 2,049,380.00 | - | 60% | 2,402,588.00 |
| | 5 | කහටගස්දිගිලිය | වැලි වැව | 35 | 22 | 1,170,000.00 | - | 80% | |
| මාතලේ | 6 | ගලේවෙල | රාලළුරොට වැව | 86 | 45 | 1,690,000.00 | 1,562,017.00 | 100% | - |
| | 7 | කොන්ගහවෙල | ළිංතොට වැව | 28 | 26 | 560,000.00 | 521,985.31 | 100% | - |
| | 8 | කිඹිස්ස | පිදුරංගල මහ වැව | 47 | 60 | 1,280,000.00 | 1,157,831.50 | 100% | - |
| පුත්තලම | 9 | ආනමඩුව | සන්කඩයාගම වැව | 36 | 47 | 790,000.00 | - | 100% | 2,238,566.49 |
| | 10 | ඉහල පුලියන්කුලම | ප්‍රියංකර වැව | 19 | 17 | 750,000.00 | - | 100% | |
| | 11 | ඉහල පුලියන්කුලම | සියඹලාගස්වැව | 29 | 27 | 875,000.00 | - | 100% | |
| වව්නියාව | 12 | ඔමන්තෙයි | කකායන්කුලම් | 35 | 12 | 1,075,000.00 | - | 50% | 2,048,615.60 |
| | 13 | වෙඬ්ඩිකුලම් | වලවයිත්තකුලම් | 29 | 15 | 1,100,000.00 | - | 40% | |
| රත්නපුර | 14 | කොලොන්න | වැ කුඹුර ඉහල වැව | 45 | 38 | 1,500,000.00 | 950,000.00 | 100% | - |
| අම්පාර | 15 | අක්කරෙයිපත්තු | වෙප්පයාඩිවැව | 195 | 170 | 2,057,754.34 | - | 75% | 1,997,819.75 |
| පොළොන්නරුව | 16 | බකමූණ | ඇලිකිඹුලාවෙල වැව | 100 | 60 | 1,400,000.00 | - | 100% | 1,242,640.00 |
| ත්‍රිකුණාමලය | 17 | කිලිවෙඬ්ඩි | කිරාන්කුලම් | 118 | 52 | 802,864.14 | 766,071.00 | 100% | - |
| හම්බන්තොට | 18 | වීරකැටිය | පුහුල්හේන වැව | 19 | 16 | 773,300.00 | - | 100% | 657,745.55 |
| එකතුව | | | | | | **20,570,568.18** | **6,679,978.31** | | **11,497,373.29** |

**281-2-2-10-2502-1 - පුරන් කුඹුරු නැවත වගා කිරීම.**

**වැව් ගැඹුරු කිරීම (අවිච්ඡේද) = Rs 11,383,523.29**

**හදිසි ස්වාභාවික විපත් වලදී වාරිමාර්ග ආරක්ෂා කර ගැනීම = Rs 113,850.00**

**Rs 11,497,373.29**

# භාණ්ඩ හා සේවා සපයා ගැනීම් - 2012

ප්‍රගති වාර්තාව

ප්‍රතිපාදන : රු.මි. 20.00 වැය ශීර්ෂය : 281-2-2-10-2502-1

| අංකය | භාණ්ඩය හෝ සේවාව | වැඩසටහන | මුදල (රු.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය | භෞතික |
| 1 | ගාල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල ඡන්ද්‍රිකා ඡායා රූප මිලදී ගැනීම | පුරන් කුඹුරු සඳහා දත්ත පාදමක් සැකසීම | 7,350,792.96 | 100% | 100% |
| 2 | Soil Consolidation Test Machine මිලදී ගැනීම | වාරිමාර්ග ඉදිකිරීම් තත්වපාලන | 1,509,760.00 | 100% | 100% |
| 3 | Arc GIS මෘදුකාංගය මිලදී ගැනීම | පුරන් කුඹුරු සඳහා දත්ත පාදමක් සැකසීම | 1,999,200.00 | 100% | 100% |
| 4 | AO Plotter යන්ත්‍රයක් මිලදී ගැනීම | පුරන් කුඹුරු සඳහා දත්ත පාදමක් සැකසීම | 621,800.00 | 100% | 100% |
| 5 | කෘෂි පාරිසරික හා ජලධාරා අත්පොත දෙමළ මාධ්‍ය පිටපත් මුද්‍රණය | කෘෂිකාර්මික සැලසුම්කරණය සඳහා නිලධාරීන් පුහුණුව | 1,241,560.32 | 100% | 100% |
| 6 | Buffer Solution මිලදී ගැනීම | පස් පරීක්ෂණ වැඩසටහන | 302,500.00 | 100% | 100% |
| 7 | Survey Grade GNSS Reciever මිලදී ගැනීම | පුරන් කුඹුරු සඳහා දත්ත පාදමක් සැකසීම | 2,469,717.20 | 100% | 100% |
| 8 | Map Info Professional Ver - ii පරිගණක මෘදුකාංගය මිලදී ගැනීම | පුරන් කුඹුරු සඳහා දත්ත පාදමක් සැකසීම | 773,925.60 | 100% | 100% |
| 9 | Trimble R6-RTK Receiver පරිගණක මෘදුකාංගය මිලදී ගැනීම | පුරන් කුඹුරු සඳහා දත්ත පාදමක් සැකසීම | 3,360,000.00 | 100% | 100% |
| 10 | පරිගණක මුද්‍රණ යන්ත්‍ර සඳහා අවශ්‍ය තීන්ත හා ලිපි ද්‍රව්‍ය | පුරන් කුඹුරු සඳහා දත්ත පාදමක් සැකසීම | 370,743.92 | 100% | 100% |

# 2011 දැයට කිරුළ වැඩසටහන යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථාන අලුත්වැඩියා කිරීම. 2011 අවිච්ඡේද කර්මාන්ත

## අනුරාධපුර දිස්ත්‍රික්කය.

වැය ශීර්ෂය : 281-2-2-0-2001(1)

| අනු අංකය | ව්‍යාපෘතිය | වෙන් කල මුදල රු. | ගිවිසුම්ගත මුදල රු. | වියදම රු. | වර්තමාන තත්වය |
|---|---|---|---|---|---|
| 1 | අනුරාධපුර ගො.සේ.ම අලුත්වැඩියාව | 1,603,544.00 | 1,603,544.00 | 1,593,240.00 | 100% |
| 2 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ තාප්පය සැකසීම | 1,260,081.00 | 1,260,081.00 | 1,213,747.02 | 100% |
| 3 | රණෝරාව ගො.සේ.ම අලුත්වැඩියාව | 1,163,261.79 | 1,163,261.79 | 1,116,687.63 | 100% |
| 4 | පදවිය ගො.සේ.ම අලුත්වැඩියාව | 1,538,495.00 | 1,538,495.00 | 1,182,990.26 | 100% |
| 5 | ඇතාකඩ ගො.සේ.ම අලුත්වැඩියාව | 1,348,498.55 | 1,348,498.55 | 1,307,729.85 | 100% |
| 6 | ගලෙන්බිඳුණුවැව ගො.සේ.ම අලුත්වැඩියාව | 1,840,056.02 | 1,840,056.02 | 1,745,881.05 | 100% |
| 7 | මඩාටුගම ගො.සේ.ම අලුත්වැඩියාව | 1,019,767.00 | 1,019,767.00 | 949,348.50 | 100% |
| 8 | කැකිරාව ගො.සේ.ම අලුත්වැඩියාව | 1,763,531.00 | 1,763,531.00 | 1,733,969.30 | 100% |
| 9 | පරංගියාවාඩිය ගො.සේ.ම අලුත්වැඩියාව | 1,984,336.40 | 1,984,336.40 | 700,832.81 | 80% |
| 10 | මුරියාකඩවල ගො.සේ.ම අලුත්වැඩියාව | 1,272,875.25 | 1,272,875.25 | 1,001,225.82 | 100% |
| 11 | මරදන්කඩවල ගො.සේ.ම අලුත්වැඩියාව | 530,034.25 | 530,034.25 | 529,993.62 | 100% |
| 12 | තිරප්පනේ ගො.සේ.ම අලුත්වැඩියාව | 1,031,214.00 | 1,031,214.00 | 979,007.95 | 100% |
| 13 | ඉපලෝගම ගො.සේ.ම අලුත්වැඩියාව | 1,205,465.50 | 1,205,465.50 | 1,161,473.14 | 100% |
| 14 | පලුගස්වැව ගො.සේ.ම අලුත්වැඩියාව | 1,320,000.00 | 1,320,000.00 | 1,272,689.85 | 100% |
| 15 | පූනෑව ගො.සේ.ම අලුත්වැඩියාව | 1,902,225.35 | 1,902,225.35 | 1,848,772.26 | 100% |
| 16 | ශ්‍රාවස්ථිපුර ගො.සේ.ම අලුත්වැඩියාව | 1,197,874.12 | 1,197,874.12 | 594,983.25 | 100% |
| 17 | තඹුත්තේගම ගො.සේ.ම අලුත්වැඩියාව | 1,603,544.00 | 1,860,561.56 | 1,039,292.10 | 100% |
| 18 | එප්පාවල ගො.සේ.ම අලුත්වැඩියාව | 1,260,081.00 | 1,350,788.91 | 1,349,816.59 | 100% |
| 19 | රාජාංගනය ගො.සේ.ම අලුත්වැඩියාව | 1,163,261.79 | 1,389,490.80 | 1,343,816.86 | 100% |
| 20 | දිස්ත්‍රික් කාර්යාලයේ පරිගණක කාමරය ඉදිකිරීම | 1,538,495.00 | 1,188,710.01 | 638,603.71 | 100% |
| 21 | රඹෑව ගො.සේ.ම අලුත්වැඩියාව | 1,348,498.55 | 426,309.20 | 420,977.27 | 100% |
| 22 | සිවලාකුලම ගො.සේ.ම අලුත්වැඩියාව | 1,840,056.02 | 1,947,688.22 | 1,198,652.74 | 100% |
| 23 | කැබිතිගොල්ලෑව ගො.සේ.ම අලුත්වැඩියාව | 1,019,767.00 | 1,036,858.50 | 723,000.30 | 100% |
| 24 | මැදවච්චිය ගො.සේ.ම අලුත්වැඩියාව | 1,338,265.10 | 1,338,265.10 | 1,316,924.16 | 100% |
| 25 | කටියාව ගො.සේ.ම අලුත්වැඩියාව | 1,257,894.75 | 1,257,894.75 | 505,731.51 | 100% |
| 26 | ජේමඩුව ගො.සේ.ම අලුත්වැඩියාව | 1,252,599.59 | 1,252,599.59 | 1,252,599.55 | 100% |
| 27 | කපුගොල්ලෑව ගො.සේ.ම අලුත්වැඩියාව | 1,997,656.75 | 1,997,656.75 | 1,470,206.92 | 100% |
| 28 | යකල්ල ගො.සේ.ම අලුත්වැඩියාව | 1,998,803.03 | 1,998,803.03 | 1,631,445.39 | 100% |
| 29 | දිස්ත්‍රික් කාර්යාලයේ රැස්වීම් ශාලාව හා රියදුරු නේවාසිකාගාරය අලුත්වැඩිය | 825,000.00 | 825,000.00 | 785,353.75 | 100% |
| 30 | නෑගම්පහ ගො.සේ.ම අලුත්වැඩියාව | 1,981,486.40 | 1,981,486.40 | 1,829,335.40 | 100% |
| 31 | දිස්ත්‍රික් කාර්යාලයට අමතර කොටසක් එකතු කිරීම | 1,239,561.20 | 1,239,561.20 | 376,996.23 | 80% |
| 32 | තන්තිරිමලේ ගො.සේ.ම අලුත්වැඩියාව | 715,955.00 | 715,955.00 | 715,955.00 | 100% |
| 33 | කෝන්වැව ගො.සේ.ම අලුත්වැඩියාව | 1,968,039.89 | 1,968,039.89 | 1,424,352.63 | 90% |
| 34 | දිස්ත්‍රික් කාර්යාලයේ ගබඩාව සංවර්ධනය කිරීම | 984,375.20 | 984,375.20 | 82,191.52 | 50% |
| 35 | හොරොව්පතාන ගො.සේ.ම අලුත්වැඩියාව | 1,625,777.80 | 1,625,777.80 | 559,340.10 | 100% |
| | පරිපාලන වියදම | 1,500,000.00 | | 377,631.84 | |
| | එකතුව | 49,867,081.14 | 48,367,081.14 | 37,597,164.04 | 97% |